18	අනුරාධපුර/ මහවිලච්චිය	තන්තිරිමලය කෞතුකාගාරය පවත්වා ගෙන යාම	81,000.00	51,642.00	64%	95%

19	අනුරාධපුර/ ම.නු.ප	අනුරාධපුර කෞතුකාගාරය පවත්වා ගෙන යාම	124,000.00	114,251.45	92%	98%
20	අනුරාධපුර/ ම.නු.ප	අනුරාධපුර කෞතුකාගාරයේ ගිණි නිවන පද්ධති ස්ථාපිත කිරීම	1,200,000.00	-	-	100%
21	අනුරාධපුර/ ම.නු.ප	අනුරාධපුර කෞතුකාගාරයේ ප්‍රදර්ශන අඩුපාඩු සකස් කිරීම	800,000.00	705,604.76	88%	70%
22	මොණරාගල/ මොණරාගල	මාලිගාවිල තොරතුරු මධ්‍යස්ථානය පවත්වා ගෙන යාම	69,000.00	33,826.00	49%	100%
23	මොණරාගල/ වැල්ලවාය	බුදුරුවගල කෞතුකාගාරය පවත්වා ගෙන යාම	94,000.00	71,165.00	76%	100%
24	කෑගල්ල / වරකාපොළ	දැදිගම කෞතුකාගාරය පවත්වා ගෙන යාම	67,000.00	42,930.00	64%	100%
25	රත්නපුර/ කොළොන්න	මඩුවන්වෙල කෞතුකාගාරය පවත්වා ගෙන යාම	33,000.00	27,410.00	83%	70%
26	රත්නපුර/ කොළොන්න	රංචාමඩම කෞතුකාගාරය පවත්වා ගෙන යාම	6,390.00	-	-	7%
27	අම්පාර/ ලාහුගල	ලාහුගල තොරතුරු මධ්‍යස්ථානය පවත්වා ගෙන යාම	8,000.00	7,937.00	99%	95%
28	අම්පාර/ අඩ්ඩාලච්චේන	දීඝවාපිය කෞතුකාගාරය පවත්වා ගෙන යාම	8,000.00	7,937.00	99%	95%
29	ත්‍රිකුණාමලය/ කඩවත්සතර	සමුද්‍ර නාවික ඉතිහාස කෞතුකාගාරය පවත්වා ගෙන යාම	86,850.00	49,925.00	57%	65%
30	ත්‍රිකුණාමලය/ සේනුවර	වෙල්ගම්වෙහෙර කෞතුකාගාරය පවත්වා ගෙන යාම	42,000.00	8,891.00	21%	60%
31	ත්‍රිකුණාමලය/ සේරුවිල	සේරුවිල කෞතුකාගාරය පවත්වා ගෙන යාම	73,000.00	23,786.00	33%	60%
			3,740,300.00	**2,086,008.18**	**56%**	**77%**

කෞතුකාගාර පවත්වා ගෙන යාම



කෝට්ටේ
කෞතුකාගාරය



වව්නියා
කෞතුකාගාරය



බුදුරුවගල
කෞතුකාගාරය



යාපනය
කෞතුකාගාරය

මහනුවර පැරණි රජවාසල සංරක්ෂණය

ඇමරිකානු තානාපති අරමුදල යටතේ 2021 වර්ෂයේ අගෝස්තු මස සිට ක්‍රියාත්මක වන ව්‍යාපෘතියකි. දීර්ඝ කාලයක් තුළ මෙම ස්මාරකය නඩත්තු කිරීමකින් තොරව පැවතීම තුළ මෙම ස්මාරකයේ වහල දැඩි ලෙස හායනයට පත්ව පැවතිණි. එයට අතිරේකව ශිලාමය කයිරුව, බිත්ති, දොර ජනෙල් සහ දැව කුළුණු ද සංරක්ෂණය කළ යුතු මට්ටමක පැවතුණි. සංරක්ෂණ කාර්යය ක්‍රියාත්මක කිරීම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සෘජු අධීක්ෂණය මත ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ උපදේශනය යටතේ කොන්ත්‍රාත් පදනමින් මෙම සංරක්ෂණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. මහනුවර රජවාසලේ පැවැත්ම තහවුරු කිරීම ව්‍යාපෘතියේ අරමුණයි. 1960 සිට මහනුවර පුරාවිද්‍යා කෞතුකාගාරය මෙම ස්මාරකය තුළ ස්ථාපිත කර ඇති අතර, කෞතුකාගාරය ප්‍රතිසංවිධානය කිරීමේ කටයුතු ද මෙම ව්‍යාපෘතිය යටතේ සිදුවේ.

මහනුවර රජවාසලේ සංරක්ෂණ කාර්යය

වහල සංරක්ෂණය





කුළුණු සංරක්ෂණය



තනාපති නිලධාරීන්ගේ නිරීක්ෂණය



දොර ජනේල සංරක්ෂණ කටයුතු





පිටත බැමි සංරක්ෂණය





පුරාවස්තු සංරක්ෂණය





සාරාංශය

2023 වසරේ මුහුණ දීමට සිදු වූ අභියෝග හමුවේ වුව ද දෙපාර්තමේන්තුවට වෙන් වූ ප්‍රතිපාදනයන් වඩාත් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස උපයෝජනය කර ගනිමින් ශාස්ත්‍රීය අංශයන් ප්‍රාදේශීය හා දිස්ත්‍රික් කාර්යාල සමඟ සම්බන්ධ වෙමින් සංවර්ධන වැඩසටහන යටතේ පුරාවිද්‍යාත්මක ස්ථාන හා ස්මාරක ගවේෂණය, කැණීම් හා පර්යේෂණ ව්‍යාපෘති 36ක් ද, සංරක්ෂණ හා නඩත්තු ව්‍යාපෘති 97ක් ද, පුරාවිද්‍යාත්මක ස්ථාන හා ස්මාරක ප්‍රවර්ධනය හා මහජන ප්‍රදර්ශණය යටතේ ව්‍යාපෘති 37ක් ද ඇතුළත්ව ව්‍යාපෘති 170 ක් ක්‍රියාත්මක කරන ලද අතර, ඉන් ව්‍යාපෘති 145 ක ව්‍යාපෘති කාර්යයන් අවසන් කරමින් 76% සමස්ත භෞතික ප්‍රගතියක් අත්කර ගමින් සැලකිය යුතු කාර්යභාරයක් සිදු කර ඇත.

2023 වසර සඳහා පොදු තැන්පත් හා බාහිර ආයතන අධාර මඟින් ලබා දී ඇති ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 25.441 ක් වන අතර, පළාත් හා දිස්ත්‍රික මට්ටමින් ක්‍රියාත්මක වෙමින් පැවති ව්‍යාපෘති ගණන 29 කි. පසුගිය වර්ෂයන්හි මධ්‍යම සංස්කෘතික අරමුදල් ප්‍රතිපාදනවල ඉතිරි ප්‍රතිපාදන මාරු කිරීම් යටතේ ව්‍යාපෘති 17 ක් හා බාහිර පාර්ශවයන්ගේ අධාර යටතේ (කාර්යය අනුමැති) ව්‍යාපෘති 57 ක් වසර තුළ ක්‍රියාත්මක වූ අතර, ඒ අනුව පොදු තැන්පත් හා බාහිර පාර්ශවයන්ගේ ආධාර යටතේ ව්‍යාපෘති 103 ක් 2023 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලදි.

2023 වසරේ පුරාවස්තු විනාශයන් සම්බන්ධ වාර්තා වීම් අතර අනවසර කැණීම් 299 ක්, පුරාවස්තු විනාශයන් 116 ක්, පුරාවස්තු සොරකම් 129 හා වෙනත් සිද්ධීන් 04 ක් විය. 2023 වර්ෂයේ අධිකරණ දඩ මුදල් වශයෙන් අය කර ඇති මුදල රුපියල් 24,477,000.00 කි.

දෙපාර්තමේන්තුවේ මානව සම්පත වැඩිදියුණු කිරීම, කාර්යක්ෂම මහජන සේවයක් සැලසීම සහ පුරාවිද්‍යාත්මක උරුමය සුරක්ෂිත කිරීම යන අරමුණු මුල් කර ගනිමින් ශාස්ත්‍රීය, න්‍යායික හා ප්‍රායෝගික දැනුම, අකල්ප, කුසලතා සංවර්ධනය යටතේ පුහුණු වැඩසටහන් 16 ක් 2023 වසර තුළ සිදු කරන ලදි. ප්‍රාදේශීය කාර්යාවල පැවති පුරප්පාඩු සඳහා බහුකාර්ය සංවර්ධන පුහුණුලාභීන් ස්ථීර පදනමින් 842 දෙනෙක් 2023 වසර තුළ දෙපාර්තමේන්තුවට අනුයුක්තව බඳවා ගෙන ඇත.

අභියෝග හා ඉදිරි ඉලක්ක

ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක උරුමය ජාතියේ අතීතයට අයත් භෞතික අවශේෂ දහස් ගණනක් වූ පුරාවිද්‍යා ස්ථාන, ස්මාරක සහ චංචල පුරාවස්තු වලින් සමන්විත වේ. මෙම උරුමයන් මනා ලෙස කළමනාකරණය කොට මතු පරපුරට දායාද කිරීම ජාතියේ අවශ්‍යතාවයකි. ගවේෂණය හා පර්යේෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, එහි ප්‍රතිඵලයන් වාර්තා කිරීම, සංරක්ෂණය, නඩත්තු කර පවත්වා ගෙන යාම හා පුරාවස්තු නියාමනය ජනතාව අතරට ගෙන යාම දෙපාර්තමේන්තුවෙන් ඉටුවිය යුතු ප්‍රධානතම කරුණ වන අතර, ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක කටයුතුවල ස්ථායීභාවය, එහි ගුණාත්මක ප්‍රවර්ධනය හා චිරස්ථායීභාවය පවත්වා

ගනිමින් පුරාවිද්‍යා ස්ථාන ප්‍රශස්ත මට්ටමට ගැනීම, සුවිශේෂී වූ පුරාවිද්‍යා ස්ථාන උත්ශ්‍රේණි කිරීම, විශ්වීය වැදගත්කමක් ඇති පුරාවිද්‍යා ස්ථාන ලෝක උරුම තත්ත්වයට උත්ශ්‍රේණි කිරීම, සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනයට හා රාජ්‍ය ආදායම් උත්පාදනයට දායකත්වයක් ලබා දීම දෙපාර්තමේන්තුවේ ඉදිරි ඉලක්ක හා අරමුණු අතර ප්‍රධාන වේ. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීමට දරන ලද ප්‍රයත්නයේ දී දෙපාර්තමේන්තුවට විවිධ ගැටළු හා අභියෝගයන්ට මුහුණ දීමට සිදු වේ.

- නෛතික රාමුව තුළ පවතින ඉඩකඩ සීමිත බැවින් ජීවමාන සංස්කෘතීන් පවත්වා ගෙන යාමේ දී පැනනඟින ප්‍රායෝගික ගැටළු හේතුවෙන් හඳුනාගත් පුරාවිද්‍යාත්මක වටිනාකම්වලින් යුත් ස්මාරක හා රක්ෂිතයන්හි මැනුම් කටයුතු සිදු කිරීමේ දී අපහසුතාවයක් පැවතීම හා රජයේ ගැසට් මඟින් ප්‍රකාශයට පත් කිරීම ප්‍රමාද වීම.
- බනිජ නිස්සාරණ බලපත්‍ර හා සංවර්ධන යෝජනා සඳහා වන හානි ඇගයීම් වාර්තා ලබා දීමේ ගැටළු.
- අනවසර කැණීම් හා නීතිවිරෝධී මානව ක්‍රියාකරකම් මඟින් සිදු කරන පුරාවස්තු විනාශයන් හේතුවෙන් පුරාවස්තුවල ආරක්ෂාව සම්බන්ධයෙන් උද්ගත වී ඇති ගැටළු.
- පුරාවස්තු විනාශයන් පිළිබඳව පරීක්ෂා කිරීමේ ගැටළු හා නීතිය ක්‍රියාත්මක කිරීමේ දී උද්ගත වන ප්‍රායෝගික ගැටළු.
- ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී කාර්ය මණ්ඩලය සක්‍රීයව සම්බන්ධ නොවීම.
- අනුමත නියමු යෝජනාවන්ට අනුව වාර්ෂික ඇස්තමේන්තු හෝ ප්‍රමුඛතා ලැයිස්තු සකස් නොවීම.
- බාහිර ආයතන හා පාර්ශවකරුවන් සමඟ මනා සම්බන්ධතාවයක් නොවීම.
- පුරාවිද්‍යා ස්ථාන බොහොමයක සංචාරකයින් සඳහා අවශ්‍ය මූලික පහසුකම් ප්‍රමාණවත් නොවීම.
- පුරාවිද්‍යා ස්ථානවල ආරක්ෂාව සඳහා නිලධාරීන් යෙදවීමේ ගැටළු,
- වෙනත් ආයතනවලට අයත් (වනජීවී දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා ආරක්ෂක අමාත්‍යාංශය වැනි) පුරාවස්තු සහිත භූමි ප්‍රදේශවල පුරාවිද්‍යාත්මක කටයුතු සිදු කිරීමේ දී අවසර ගත යුතු බැවින්, ඒ සඳහා සැලකිය යුතු කාලයක් ගත වීම.
- සීමිත මූල්‍ය හා භෞතික සම්පත්, අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පැවතීම, විශේෂඥ දැනුමේ සාපේක්ෂ හිඟය, කාර්යමණ්ඩල නව සංකල්ප, ආකල්ප, නව තාක්ෂණය, නව මානයන්, ජාතික අවශ්‍යතා, විෂය ප්‍රවීනත්වය හා පුහුණු අවශ්‍යතා හඳුනා නොගැනීම හා අවබෝධ නොවීම,

2.2 ඉදිරියේදී ආයතනයේ කාර්යසාධනය වර්ධනය කර ගැනීම සඳහා අනුගමනය කිරීමට අපේක්ෂිත කෙටිකාලීන හා මධ්‍යකාලීන ක්‍රියාමාර්ග

- පුරාවිද්‍යාත්මක උරුමය මනා කළමනාකරණය සඳහා අවශ්‍ය වන නෛතික පසුබිම ශක්තිමත් කිරීම පිණිස පුරාවස්තු ආඥා පනත සහ ජාතික පුරාවිද්‍යා ප්‍රතිපත්තිය සංශෝධනයට අවශ්‍ය කඩිනම් පියවර ගැනීම.
- අරමුණු සාධනය කර ගැනීම සඳහා පාදක කර ගනු ලබන වැඩසටහන් හා ව්‍යාපෘති වලට අදාළ නියමු සැලසුම් සකස් කිරීම, කාලානුරූපව අධීක්ෂණය, මෙහෙය වීම, සමාලෝචනය හා පසුවිපරම යන සැම කාර්යයක්ම සැලසුමකට අනුව යාවත්කාලීනව සිදු කිරීම.
- ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී පුරාවිද්‍යා විෂය දැනුම සහිත නිලධාරීන් යොදා ගැනිම, ප්‍රධාන කාර්යාලයේ අධීක්ෂණය හා සම්බන්ධීකරණය.
- අක් මුදල් නිසි වේලාවට ලබා ගැනීම හා ප්‍රසම්පාදන කටයුතු නිසි කලට සිදු කර ගැනිම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම.
- ගැසට් කිරීම සඳහා හඳුනා ගෙන යෝජනා වී ඇති ස්මාරක සහ රක්ෂිත ගැසට් කිරීම සඳහා අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කිරීම.
- උරුම කළමනාකරණය සඳහා නිවැරදි අවකාශීය දත්ත රැස් කිරීම, ලේඛනගත කිරීම හා භූගෝලිය දත්ත ගොනු සැකසීම, හඳුනා ගන්නා නව ගවේෂණ හා පර්යේෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- අධිකරණ ක්‍රියාදාමයේදී අයකරන දඩ මුදලින් ප්‍රතිශතයක් (25%) දෙපාර්තමේන්තුවට අයකර ගැනීම හා ඉන් කොටසක් ස්මාරක සංරක්ෂණ හා නඩත්තු වලට වෙන් කිරීම.
- ඓතිහාසික පුරාවිද්‍යාත්මක වටිනාකම් සහිත ස්ථාන පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම හා වාර්තාගත කිරීම තුළින් උරුමය ආරක්ෂා කර ගැනීම සඳහා වැඩසටහන් ක්‍රියාවට නැංවීම හා සංරක්ෂණ කාර්යයන් සඳහා ප්‍රජා සහභාගිත්වය ලබා ගැනීම,
- පුරාවස්තු ආරක්ෂණ විශේෂ පොලිස් ඒකකය අක්‍රීය තත්ත්වයේ පවතින බැවින්, අනවසර කැණීම් හා වාර්තාවන පුරාවස්තු විනාශයන් අවම කර ගැනීම සඳහා පුරාවස්තු ආරක්ෂණ විශේෂ පොලිස් ඒකකය නැවත ස්ථාපිත කිරීම.
- ප්‍රාදේශීය මාණ්ඩලික නිලධාරීන් අනුමත කාර්ය මණ්ඩලයට අනුව ලබා දීමට ඇති හැකියාව සොයා බැලීම.
- ස්මාරක සංරක්ෂණය සඳහා ප්‍රතිපාදන බාහිර ආයතන මගින් ලබා දුන්නද කාර්මික නිලධාරීන්ගේ හිඟය නිසා වාර්ෂිකව ඉල්ලීම් සියල්ල සපුරාලිය නොහැකි වේ. එබැවින් කාර්මික නිලධාරීන් ලබා ගැනීමට සලකා බැලීම.
- දැනට ප්‍රාදේශීය කාර්යාලවල ඇති තාක්ෂණික උපකරණ (පරිගණක, ඡායාපිටපත් යන්ත්‍ර, කැමරා, ෆැක්ස් යන්ත්‍ර වැනි) ප්‍රමාණවත් නොවන අතර ප්‍රශස්ත මට්ටමක නොමැති බැවින් එම උපකරණ ලබා දීමෙන් කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම.
- ශාස්ත්‍රීමය කටයුතු හඳුනා ගනිමින් ඒ සඳහා පුහුණුව පුළුල් කිරීම තුළින් දෙපාර්තමේන්තුවේ ඵලදායීතාවය ඉහළ නැංවීම.

- ❖ සනීපාරක්ෂක හා යටිතල පහසුකම් ප්‍රවර්ධනය (පුරාවිද්‍යා ස්ථාන / සංචාරක බංගලා / කාර්යාලීය)
- ❖ මහජනා සඳහා පුරාවිද්‍යා ස්ථාන සෑම විටම විධිමත්ව හා පිරිසිදුව ප්‍රදර්ශනාත්මක මට්ටමින් පවත්වා ගෙන යාමට කටයුතු කිරීම.
- ❖ සංචාරක ප්‍රවර්ධනය සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මඟින් අවම මැදිහත් වීම් සහිතව ඉටුකළ යුතු ව්‍යාපෘති හඳුනා ගැනීම හා ව්‍යාපෘති යෝජනා වාර්ෂික ඇස්තමේන්තුවලට ඇතුළත් කිරීම.
- ❖ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙත සෘජු ආදායම් ලබා ගත හැකි ස්ථාන හා ව්‍යාපෘති හඳුනා ගැනීමත් අනෙකුත් ව්‍යාපෘති මඟින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට ලැබෙන ප්‍රතිලාභ සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම.
- ❖ පුරවිද්‍යා ස්ථානවල තොරතුරු ඊ තාක්ෂණය ඔස්සේ පහසුවෙන් ලබා ගත හැකි හෝ බාගත කර ගත හැකි පරිදි දෙපාර්තමේන්තු වෙබ් අඩවිය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. ඒ සඳහා අවශ්‍ය මූලික උපකරණ හා පහසුකම් සපයා ගැනීම. සංචාරක ආකර්ෂණය වර්ධනය කර ගැනීම සඳහා පුරාවිද්‍යා ස්ථාන පිළබඳ නිවැරදි තොරතුරු මෙන්ම ආකර්ශනීය ඡායාරූප හා විඩියෝ ජන ගත කිරීම, පුරාවිද්‍යා ප්‍රකාශන අලවිය විධිමත් කිරීම,
- ❖ පුරාවිද්‍යාත්මක උරුමයන් සංරක්ෂණය / ආරක්ෂාව සහ ප්‍රවර්ධනය සඳහා නවීන තාක්ෂණය යොදා ගැනීම.
- ❖ වියදම් පාලනය සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම සහ තොරාගත් පුරාවිද්‍යා ස්ථානයන් / සංචාරක බංගලා හා කාර්යාල සඳහා විකල්ප බලශක්ති ප්‍රභවයන් (සුර්ය පැනල) යොදා ගැනීමට කටයුතු කිරීම.

2024 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන වැඩසටහන්

2024 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට යෝජිත ක්‍රියාකාරී සැලැස්මේ සාරාංශය භාණ්ඩාගාර මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම් සමඟ පහත දක්වා ඇත.

2024 වර්ෂය සඳහා වෙන්කර ඇති මූල්‍ය ප්‍රතිපාදන

		මූලධන වියදම් (රු. මිලියන)	පුනරාවර්තන වියදම් (රු. මිලියන)
වැඩසටහන **01**	**207 - 01 - 01**	22.000	296.000
වැඩසටහන **02**	**207 - 02 - 02**	254.000	1404.000
		276.000	**1,700.000**
සමස්ත මූල්‍ය ප්‍රතිපාදන			**1,976.000**

වගු අංකය: 12 2024 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට යෝජිත ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම (සරාංශය)

අනු අංකය	ව්‍යාපෘතිය / අංශය	ක්‍රියාකාරකම්	අයවැය ප්‍රතිපාදන මුලධන (රු.මි.)	පුනරාවර්තන වියදම් (රු.මි.)	මුළු ප්‍රතිපාදන (රු.මි.)	යෝජිත ව්‍යාපෘති ගණන
	මෙහෙයුම් වැඩසටහන - 01 (සමාන්‍ය පරිපාලනය)					
	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම		**19.000**		**19.000**	
1	207-01-01-2001	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	10.000		10.000	1
2	207-01-01-2002	යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	1.000		1.000	
3	207-01-01-2003	වාහන	8.000		8.000	
	මූලධන වත්කම් අත්පත් කර ගැනීම		**2.500**		**2.500**	
4	207-01-01-2102	ගෘහ භාණ්ඩ සහ කාර්යාලයීය උපකරණ	0.500		0.500	
5	207-01-01-2103	යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	2.000		2.000	
	හැකියා වර්ධනය		**0.500**		**0.500**	
6	207-01-01-2401	කාර්ය මණ්ඩල පුහුණු	0.500		0.500	
		උප එකතුව	**22.000**		**22.000**	

	සංවර්ධන වැඩසටහන - 02 (පුරාවිද්‍යා සේවය)					
	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම		**15.000**		**15.000**	
1	207-02-02-2001	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	13.000		13.000	14
2	207-02-02-2002	යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	2.000		2.000	
	මූලධන වත්කම් අත්පත් කර ගැනීම		**4.000**		**4.000**	
3	207-02-02-2102	ගෘහ භාණ්ඩ සහ කාර්යාලයීය උපකරණ	2.000		2.000	
4	207-02-02-2103	යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	2.000		2.000	
	හැකියා වර්ධනය		**0.600**		**0.600**	
5	207-02-02-2401	කාර්ය මණ්ඩල පුහුණු	0.600		0.600	
	2509 - වෙනත්					
6	207-02-02-05-2509	**රජගලතැන්න පුරාවිද්‍යා ස්ථානය පවත්වා ගෙන යාම**	**6.100**		**6.100**	**02**
7	207-02-02-08-2509	**පුරාවිද්‍යාත්මක ස්ථාන හා ස්මාරක ගවේෂණය, කැණීම් හා පර්යේෂණ**	**5.000**	**24.047**	**29.047**	**64**
		ගවේෂණ හා ලේඛනගත කිරීම්	1.500	16.447	17.947	49
		කැණීම්	0.500	5.825	6.325	09
		අභිලේඛන හා නාණකවිද්‍යා	3.000	1.775	4.775	06

අනු අංකය	ව්‍යාපෘතිය / අංශය	ක්‍රියාකාරකම්	අයවැය ප්‍රතිපාදන මූලධන (රු.මි.)	පුනරාවර්තන වියදම් (රු.මි.)	මුළු ප්‍රතිපාදන (රු.මි.)	යෝජිත ව්‍යාපෘති ගණන
8	207-02-02-09-2509 (11)	**පුරාවිද්‍යාත්මක ස්ථාන හා ස්මාරක සංරක්ෂණය හා නඩත්තු කිරීම**	**200.000**	**46.484**	**246.484**	**268**
		වාස්තු විද්‍යා සංරක්ෂණ.	113.200	20.662	133.862	58
		රසායන සංරක්ෂණ	6.094	6.167	12.261	65
		නඩත්තු	80.706	19.655	100.361	145
9	207-02-02-09-2509 (13)	**මහනුවර රජවාසල සංරක්ෂණය ව්‍යාපෘතිය**	**5.300**		**5.300**	**1**
10	207-02-02-10-2509	**පුරාවිද්‍යාත්මක ස්ථාන හා ස්මාරක ප්‍රවර්ධනය හා මහජන ප්‍රදර්ශණය**	**15.000**	**11.402**	**26.402**	**57**
		ප්‍රවර්ධන	11.650	5.280	16.930	21
		කෞතුකාගාර	2.075	5.307	7.382	34
		මාධ්‍ය	1.275	0.815	2.090	02
11	207-02-02-12-2509	**රිටිගල පුරාවිද්‍යා ස්ථානය සංරක්ෂණය**	**1.500**		**1.500**	**1**
12	207-02-02-15-2509	**කන්නියා උණුවතුර ළිං පරිශ්‍රය නඩත්තු කර පවත්වා ගෙන යාම**	**1.500**		**1.500**	**2**
		එකතුව (වැඩසටහන 02)	**254.00**	**81.933**	**335.933**	**409**
	මුළු එකතුව	**මුළු එකතුව**	**276.000**	**81.933**	**357.933**	**410**

.....
ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා

.....
ගණන් දීමේ නිලධාරියා

.....
ආයතන ප්‍රධානියා

ඒ.එම්.පී.එම්.බී අතාපත්තු
මල්ලාල්
බුද්ධශාසන ආගමික හා රූපයකාර්ත්ත කටයුතු
අමාත්‍යාංශය
8 වන මහල, "සෙත්සිරිපාය"
බත්තරමුල්ල

මහාචාර්ය කී.තුසිත මැනුදීස්
පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
සිරිමත් මාවත
කොළඹ 07.

03.පරිච්ඡේදය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය **ඒසිඒ-එෆ්**

2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2023 (රු.)		සටහන	තක්ෂ (රු.)		
			2023	2022	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	1	-	-	ඒසිඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		1,264,265,303	1,104,020,000	ඒසිඒ-3
-	තැන්පතු		76,059,289	64,503,922	ඒසිඒ-4
-	අත්තිකාරම් ගිණුම්		46,538,303	43,793,644	ඒසිඒ-5
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**1,386,862,895**	**1,212,317,566**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**1,386,862,895**	**1,212,317,566**	
-	**භාණ්ඩාගාරයට ප්‍රේෂණ(ඇ)**		**26,788,750**	**221,982**	
-	**ශුද්ධ ආදායම් ලැබීම් හා ආදායම් නොවන ලැබීම් ඉ= (ඇ)-(ඈ)**		**1,360,074,145**	**1,212,095,584**	
-	**අඩුකළා : වියදම්**				
	පුනරාවර්තන වියදම්				
1,101,989,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	1,085,858,644	1,021,476,351	
173,506,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	125,921,660	74,498,599	
5,500,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	4,127,085	4,445,945	ඒසිඒ -2(ii)
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
1,280,995,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**1,215,907,389**	**1,100,420,895**	

	මූලධන වියදම්				
16,505,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම්	**10**	10,750,082	4,769,315	**ඒසිඒ-2(ii)**
3,300,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	2,902,294	3,395,945	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	-	-	
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**	-	-	
1,000,000	හැකියා වර්ධනය	**14**	558,394	1,190,334	
145,200,000	වෙනත් මූලධන වියදම්	**15**	57,679,067	76,083,350	
166,005,000	**මුළු මූලධන වියදම් (උ)**		**71,889,837**	**85,438,944**	
-	තැන්පතු ගෙවීම්		93,481,635	64,158,747	**ඒසිඒ-4**
-	අත්තිකාරම් ගෙවීම්		50,558,620	45,634,134	**ඒසිඒ-5**
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්(ඊ)		-	-	
-	**ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)**		**144,040,255**	**109,792,881**	
1,447,000,000	**මුළු වියදම් එ = (ඊ+උ+ඌ)**		**1,431,837,481**	**1,295,652,720**	
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඒ = (ඉ-එ)		**(71,763,336)**	**(83,557,136)**	
-	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(71,763,336)	(83,557,136)	**ඒසිඒ-7**
-	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	**ඒසිඒ-3**
			-	-	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

2023 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	කතය 2023 (රු.)	2022 (රු.)
මූල්‍ය නොවන වත්කම්			
දේපළ පිරියත හා උපකරණ	ඒසීඒ-6	1,131,093,016	1,128,190,722
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5 (ඒ)	115,104,660	111,084,342
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3		-
මුළු වත්කම්		**1,246,197,676**	**1,239,275,064**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		59,483,753	38,041,089
දේපළ පිරියත හා උපකරණ සංචිතය		1,131,093,016	1,128,190,722
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5 (ආ)	-	-
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ - 4	55,620,907	73,043,253
අග්‍රිම ශේෂය	ඒසීඒ - 3	-	-
මුළු වගකීම්		**1,246,197,676**	**1,239,275,064**

පිටු අංක 01 සිට 43 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් නොරතුරු සහ ඇමණුම් පිටු අංක 44 සිට 73 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් නොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත්, ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින්වර සමාලෝචන සිදු කරන බවත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන් දීමේ නිලධාරී	ගණන් දීමේ නිලධාරී	ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/කොමසාරිස් මුදල්
නම්:	නම්:	නම්:
තනතුර:	තනතුර:	තනතුර:
දිනය: 2024.	දිනය: 2024.12.24	දිනය: 2024. 07.28
ඒ.එම්.පී.එම්.බී. අතපත්තු ඔල්කම් බුද්ධශාසන භාගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය 8 වන මහල, 'සෙත්සිරිපාය' බාරාගම්බර	මහාචාර්ය ඩී.තුසිත මැනුවල් පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ශ්‍රීමත් මාක්ස් ප්‍රනාන්දු මාවත කොළඹ 07.	ඒ.ඩී.සී. ගල්හේවත්ත ප්‍රධාන ගණකාධිකාරි පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ශ්‍රීමත් මාක්ස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07

3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය ඒසිඒ-සී

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන
මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

	තත්‍ය (රු.)	
	2023	**2022**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	119,353,739	107,133,463
අග්‍රිම ලැබීම්	1,264,265,303	1,104,020,000
අත්තිකාරම් අයකර ගැනීම්	44,636,746	43,736,680
තැන්පතු ලැබීම්	76,059,289	64,503,922
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**1,504,315,077**	**1,319,394,065**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	1,207,409,779	1,100,424,994
සහනාධාර සහ මාරුකිරීම්	4,127,084	4,445,945
වෙනත් ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	50,202,937	25,719,061
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	26,788,750	221,982
අත්තිකාරම් ගෙවීම්	50,547,220	46,003,453
තැන්පතු ගෙවීම්	93,481,635	64,158,747
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**1,432,557,405**	**1,240,974,182**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ) =(අ)-(ආ)	**71,757,672**	**78,419,883**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
අත්තිකාරම් අයකර ගැනීම්		
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
මූලධන	71.757.672	
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**71,757,672**	**78,419,883**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(71,757,672)**	**(78,419,883)**

මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
තැන්පතු ලැබීම්		
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (උෑ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(උෑ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්

* මූල්‍ය ප්‍රකාශ සටහන් ඉදිරිපත් කර ඇත.

3.5. ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව (රු.)	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
20.02.02.99	අත්තිකාරම් බී ගිණුමේ පොළිය	3,500,0000.00		3,857.979.92	110.2
20.03.02.99	විකුණුම් හා ගාස්තු	16,000,000.00		30,453,152.77	190.3
20.03.03.02	අධිකරණ දඩ මුදල්	20,000,000.00		24,477,000.00	122.4

3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන (රු.)		තත්‍ය වියදම (රු.)	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	1,286,000,000	1,280,995,000	1,215,907,389	95%
ප්‍රාග්ධන	161,000,000	166,005,000	71,889,837	43%

3.7 මු. රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිසත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රතිපාදනය කරන ලද ප්‍රතිපාදන

ප්‍රතිපාදන ලබා දුන් අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන (රු.)		තත්‍ය වියදම (රු.)	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස
		මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ත්‍රිකුණාමලය	කන්නියා උණුවතුර ළිං පරිශ්‍රය නඩත්තු කිරීම	1,000,000.00	150,000.00	132,164.63	88

*** 2023.03.01 දින සිට රු.850,000.00 ක ප්‍රතිපාදන නැවත පවරා ගෙන ඇත.**

3.8 මුල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

වත්කම් කේතය	කේත විස්තරය	**31.12.2023** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය (රු.)	**31.12.2023** දිනට මුල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය (රු.)	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය% ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්		138,320,748		
9152	යන්ත්‍රෝපකරණ		81,272,268		
9153	ඉඩම්		911,500,000		
9154	අස්පෘශ්‍ය වත්කම්				
9155	ජීව විද්‍යාත්මක වත්කම				
9160	කෙරීගෙන යන වැඩ				
9180	බදු දෙන ලද වත්කම්				

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. CAA/B/DA/02/ FA /23/176 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2024 මැයි 31 දින

අධ්‍යක්ෂ ජනරාල්
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

ශීර්ෂය 207 - පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 207 - පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
3.8 (එ) 154 (6) වාර්තාව	ඉඩම් හා ගොඩනැගිලිවල අයිතිය දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම.	1.6.1

1.6. **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.6.1. **මූල්‍ය නොවන වත්කම්**

දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් රු. 911,500,000 ක් වූ ඉඩම් සහ රු.138,320,748 ක් වූ ගොඩනැගිලි, 2018 දෙසැම්බර් 31 දිනැති අංක 04/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව ප්‍රත්‍යාගණනය කර නිවැරදි වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. තවද, දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය පිහිටි දේපළෙහි අයිතිය පවරා ගැනීමේ කටයුතු ද අවසන් කර නොතිබුණි.

1.6.2. මූල්‍ය වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2023 දෙසැම්බර් 31 දිනට රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමේ කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ ශේෂ එකතුව රු.114,722,046 ක් වුවද, එය ණය පාලන ගිණුමේ රු.115,104,660 ක් වශයෙන් සඳහන් කර තිබීමෙන් රු.382,614 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) 2023 දෙසැම්බර් 31 දිනට මිය යාම, විශ්‍රාම යාම, වැඩ තහනම් කිරීම හා සේවය හැර යාම යනාදී හේතූන් මත දැනට සේවයේ නොමැති නිලධාරීන් 70 දෙනෙකුගෙන් අයවිය යුතු රු.3,716,348 ක් වූ ණය ශේෂය තුළ නිලධාරීන් 28 දෙනෙකුගෙන් වර්ෂ 05 කට වැඩි කාලයක සිට හිඟහිටි රු.1,440,671 ක ණය ශේෂ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.5 හා 4.6 ඡේද ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) බැංකු ප්‍රකාශනය හා බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව 2023 දෙසැම්බර් 31 දිනට රු.67,168,182 ක් වූ බැංකු ශේෂය මූල්‍ය ප්‍රකාශනවල ඇමුණුම (viii) හි රු.1,579,237,084 ක් ලෙස රු.1,512,068,902 ක් වැඩියෙන් දක්වා තිබුණි.

1.6.3. ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

	ලේඛන වර්ගය	අදාළ රෙගුලාසිය	නිරීක්ෂණ
(අ)	ඇප ලේඛනය	මුදල් රෙගුලාසි 891 (1)	යාවත්කාලීන කර නොතිබුණි.
(ආ)	විදුලි උපකරණ පිළිබඳ ලේඛනය	මුදල් රෙගුලාසි 454 (2)	පවත්වා නොතිබුණි.
(ඇ)	ණයගැති හා ණයහිමි ලේඛනය	2017 ජූලි 05 දිනැති අංක 256/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 5 ඡේදය	යාවත්කාලීන කර නොතිබුණි.
(ඈ)	මහේස්ත්‍රාත් වෙත යවනු ලබන වාර්තා පිළිබඳ තොරතුරු ඇතුළත් ලේඛනය	1998 අංක 24 දරන පුරාවස්තු (සංශෝධන) පනතින් සංශෝධිත 1940 අංක 09 දරන පුරාවස්තු ආඥා පනතෙහි 15 (ඇ) වගන්තිය	යාවත්කාලීන කර නොතිබුණි.
(ඉ)	පුරාවස්තු පිළිබඳ ලේඛනය	1998 අංක 24 දරන පුරාවස්තු (සංශෝධන) පනතින් සංශෝධිත 1940 අංක 09 දරන පුරාවස්තු ආඥා පනත	යාවත්කාලීන කර නොතිබුණි.
(ඊ)	පුරාවස්තු පිළිබඳ මධ්‍යගත හාණ්ඩ වට්ටෝරු ලේඛනය	මුදල් රෙගුලාසි 751	පවත්වාගෙන ගොස් නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1. බැරකම් හා බැඳීම් එළඹීම

පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු 04 දෙනෙකු වගඋත්තරකරුවන් කරමින් එක් අයෙකුගෙන් රුපියල් කෝටි 07 ක් බැහින් වන්දි මුදලක් ඉල්ලා 2016 වර්ෂයේදී බණ්ඩාරවෙල මහේස්ත්‍රාත් අධිකරණයේ පවරා ඇති M 4251 දරන නඩු කටයුත්තට අදාළව හා දෙපාර්තමේන්තුවේ ගවේෂණ නිලධාරිවරයෙක්, පර්යේෂණ නිලධාරීන් දෙදෙනෙකු, ග්‍රාම නිලධාරිවරයා සහ නීතිපතිවරයා වගඋත්තරකරුවන් ලෙස නම් කරමින් එක් අයකුගෙන් රුපියල් ලක්ෂ 10 බැහින් වන්දි මුදලක් ඉල්ලා වසර 07 ක කාලයක් තිස්සේ මාතර දිසා අධිකරණයේ පවතින

අංක M 13703 දරන නඩුවට අදාළව පවතින අසම්භාව්‍ය බැරකම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන වල සටහනක් මඟින් හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2. ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.3. නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත පරිදි විය.

නීති, රීති, රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම
(අ) 1998 අංක 24 දරන පුරාවස්තු (සංශෝධන) පනතින් සංශෝධනය කරන ලද 1940 අංක 09 දරන පුරාවස්තු ආඥා පනතෙහි 43 අ (2)	යෝජිත සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ හානි ඇගයුම් සමීක්ෂණයන් ව්‍යාපෘතියේ හෝ යෝජනා ක්‍රමයේ අනුග්‍රාහකයින්ගේ වියදමින් කරවීමට පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කටයුතු සැලැස්විය යුතු වූවත්, අදාළ ඉල්ලීම් හෝ අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීමකින් තොරව සිදුකර පැවති සංවර්ධන ව්‍යාපෘති 08 ක් පිළිබඳව

සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශක අංක: 05/2023

2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ සිංහල හා ඉංග්‍රීසි භාෂා පිටපත්වල රු.1,239,275,064 ක් වශයෙන් දැක්වෙන 2022 වර්ෂයේ මුළු වත්කම්වල එකතු අගය දෙමළ භාෂා පිටපතෙහි රු.111,084,342 ක් ලෙස රු.1,128,190,722 ක් අඩුවෙන් දක්වා තිබුණි.

2.4. තැන්පතු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුවට අවශ්‍ය මූල්‍ය නොවන වත්කම් මිලදී ගැනීම සඳහා වාර්ෂික ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන වෙන් කරගත යුතු වුවද, එසේ කටයුතු නොකර පුරාවිද්‍යාත්මක ස්ථානවල නඩත්තුව.හා කළමනාකරණය සඳහා 2023 වර්ෂය තුළදී මධ්‍යම සංස්කෘතික අරමුදල වෙතින් ලැබුණු රු.6,210,550 කින් රු.3,934,350 ක් හෙවත් සියයට 63 ක් උපයෝජනය කර කාර්යාල උපකරණ මිලදී ගෙන තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන තැන්පතු ගිණුම් 02 හි වසර 02 ඉක්ම වූ රු.22,742,458 ක තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 570 හා 571 ප්‍රකාරව නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

2.5. බැංකු ගිණුම් මෙහෙයවීම

පුරාවිද්‍යා පර්යේෂණ හා සංරක්ෂණ කටයුතු වලට පරිත්‍යාගශීලීන්ගෙන් ලැබෙන ආධාර බැර කිරීම සඳහා වෙනම ගිණුමක් පිහිටුවන ලෙසට 2021 නොවැම්බර් 16 දින ලැබී තිබුණු කැබිනට් අනුමැතිය ප්‍රකාරව, 2022 වර්ෂයේ මහජන බැංකුවේ තිඹිරිගස්යාය ශාඛාවේ ජංගම ගිණුමක් විවෘත කර තිබුණ ද, 2024 මාර්තු 28 විගණිත දින වන විටත් දේශීය හෝ විදේශීය

පරිත්‍යාගශීලීන්ගෙන් පරිත්‍යාග ලැබී නොතිබීම හේතුවෙන් ජංගම ගිණුම නිශ්කාර්යව පවතින බවට නිරීක්ෂණය විය.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 දැක්ම හා මෙහෙවර

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පුරාවිද්‍යා ස්ථාන හා රක්ෂිත රැක ගැනීම, සංරක්ෂණය හා නඩත්තු කිරීම, පුරාවිද්‍යා ස්ථානවලට හා ස්මාරකවලට හානි කරන පුද්ගලයන් සම්බන්ධ නීතිමය කටයුතු සිදු කිරීම, රටේ පවතින සියලුම පුරාවිද්‍යා ස්ථාන සම්බන්ධ අනෙකුත් ගැටලු අවධාරණය කර ගැනීම, ගවේෂණ කටයුතු වල ප්‍රගතිය හඳුනා ගැනීම, කාලීනව ලැබෙන පුරාවස්තු ලේඛනගත කිරීම හා ගබඩා කිරීම ආදී ක්‍රියාවලීන් විධිමත් කිරීම ඇතුළුව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සියළු කටයුතුවල සාර්ථකත්වය මැන බැලීම සඳහා සියළුම පුරාවිද්‍යා කලාප කාර්යාල සහ ප්‍රාදේශීය කාර්යාල ප්‍රධාන කාර්යාලය සමඟ ඒකාබද්ධ වන විධිමත් අධීක්ෂණ සැලැස්මක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව තුළ ක්‍රියාත්මක නොවීම මත පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ බොහෝ ප්‍රශ්න, ගැටලු හා ව්‍යාකූලතාවයන් නිර්මාණය වී ඇති බව නිරීක්ෂණය විය.

(ආ) පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලබාදෙන කැණීම් බලපත්‍ර හරහා බාහිර පාර්ශවයන් විසින් හඳුනා ගන්නා ලද පුරාවස්තු දෙපාර්තමේන්තුව වෙත ලබා ගැනීමේ විධිමත් ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොවීමත්, අදාළ කැණීම් වාර්තා ලබාදීමට වසර 04 ක් වැනි දිගුකාලයක් ගතවීමත් හේතුවෙන් දෙපාර්තමේන්තුවේ කාර්යභාරය කාර්යක්ෂමව සිදු නොවන බවට නිරීක්ෂණය විය.

(ඇ) බනිජ හා පාෂාණ නිස්සාරණය සඳහා වූ පුරාවිද්‍යා නිර්දේශය පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්ගේ 2019 ජූනි 01 දිනැති අංක 02/2018 දරන චක්‍රලේඛය ප්‍රකාරව 2018 ජූනි 01 දින සිට වාර්ෂිකව ලබාදුන් නමුත්, 2020 මාර්තු 05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි දිගුකාලීනව නිර්දේශ ලබාදීම හේතුවෙන් පුරා සාධක පිළිබඳ තොරතුරු අනාවරණය නොවීම මඟින් පුරාවස්තුවලට හානි සිදුවිය හැකි වීමත්, කාර්ය මණ්ඩලය හා ප්‍රවාහන පහසුකම් වල ඌනතාවයන් නිසා නැවත පරීක්ෂා කිරීම් සිදු නොවීමත් කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි.

(ඈ) කුරුණෑගල දිස්ත්‍රික්කයේ කළුගල් ව්‍යාපෘති 03 කට බලපත්‍ර ලබාදීමට අදාළව 2013 වර්ෂයේදී සිදුකළ ක්ෂේත්‍ර පරීක්ෂාවේදී පුරාවිද්‍යා සාධක අනාවරණය කරගත නොහැකි වීමෙන් පුරාවිද්‍යා හානි ඇගයීම් නිර්දේශ ලබාදී කළුගල් කැණීමේ ව්‍යාපෘති සිදුකර පැවති නමුත්, නැවත 2019 වර්ෂයේදී සිදුකළ ස්ථාන පරීක්ෂාවේදී පුරාසාධක අනාවරණය වීම හේතුවෙන් බලපත්‍ර අහෝසි කර තිබුණි. ඒ අනුව නිසි පරීක්ෂා කිරීමකින් තොරව පුරාවිද්‍යා නිර්දේශ ලබාදීම තුළින් වර්ෂ 07 ක පමණ කාලයක් තුළ ගල්බෝර දමා කළු ගල් නිස්සාරණයේදී පුරාවිද්‍යා ස්මාරක වලට හානි සිදුවී තිබුණි.

(ඉ) උතුරු පළාතේ බොහෝ පුරාවිද්‍යාත්මක ස්ථානයන්හි මූලික ගවේෂණ කටයුතු පමණක් සිදුකර ඇති අතර, විස්තීර්ණ ගවේෂණයක් මඟින් අදාළ ඉදිරි පුරාවිද්‍යාත්මක කාර්යයන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. තවද, පුරාවිද්‍යා ස්ථාන, ස්මාරක, පුරාවිද්‍යා රක්ෂිත, සංරක්ෂණය, නඩත්තුව හා කළමනාකරණය සිදුකර එම පුරාවිද්‍යා ස්ථාන ආරක්ෂා කර ගැනීමට දෙපාර්තමේන්තුව අසමත්වී පැවති බව නිරීක්ෂණය විය.

(ඊ) 2010 වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මඟින් ලබාදුන් මූල්‍ය හා තාක්ෂණික සහාය යටතේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, මධ්‍යම පරිසර අධිකාරිය හා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව අතර ඇති වූ සහයෝගිතා ගිවිසුම ප්‍රකාරව ආරම්භ කළ මූලික ගවේෂණයත් සමඟ 2018 වර්ෂයේදී පුරාවිද්‍යා ප්‍රාදේශීය කාර්යාල පිහිටුවා 2023 ජූලි මාසය වන විට උතුරු පළාතේ හඳුනාගත් 479 ක් වූ සමස්ථ පුරාවිද්‍යා ස්ථානවලින් පුරාවිද්‍යා ස්ථාන 252 ක අයිතිය පවරා ගෙන මායිම් කණු යොදා ගැසට් මඟින් ප්‍රකාශයට පත්කිරීමට කටයුතු කර නොතිබුණි.

(උ) නාගතම්බ්‍රාන්, වවුනිකුලම්, සිවපුරම් ශ්‍රීමලේ කෝවිල යන හඳුනාගන්නා ලද පුරාවිද්‍යා නටඹුන් පැවති ස්ථානයන්හි දැනටමත් ස්ථූප ගොඩැලි සම්පූර්ණයෙන්ම පොළොවට සමතලා කොට එම භූමිය තුළ සහ නෙඩුන්කේනි ශිව නගර්, කුලාමුරිප්පු, කොඩ්ඩියාමලෙ යන පුරාවිද්‍යා ස්ථානයන්හි ඇති ස්ථූප ගොඩැලි මත වෙනත් ආගමික ස්ථාන ඉදිකර තිබුණි. එසේම කව්විලාමඩු, මුතියංකට්ටු යන පුරාවිද්‍යාත්මක ස්ථානයන්හි තාවකාලිකව උතුරු පළාතේ ඉදිකර තිබූ යුධ හමුදා කඳවුරු එම ස්ථානයන්ගෙන් ඉවත් කරමින් පැවතීම හේතුවෙන් මෙම පුරාවිද්‍යා ස්ථානවල ආරක්ෂාව හා පැවැත්ම කෙරෙහි ගැටලුකාරී තත්ත්වයන් ඇති විය හැකි බවටත් නිරීක්ෂණය විය.

(ඌ) උතුරු පළාතේ පිහිටි වෙඩික්කිනාරිමලෙ පුරාවිද්‍යා ස්ථානය, නෙළුක්කුලම, කිඹුලාගල නන්දිමිත්‍රගම පුරාවිද්‍යා පරිශ්‍රයේ ඇති ස්මාරක, නෙඛුන්කේනි ශිවනගර් පුරාවිද්‍යා ස්ථානය, සමලන්කුලම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට අයත් සමලන්කුලම පුරාවිද්‍යා ස්ථානය සහ මාතොට වරාය නගරය මේ දක්වාම අදාළ මායිම් හඳුනා ගෙන පුරාවිද්‍යා රක්ෂිතයක් හෝ ස්මාරකයක් ලෙසට ගැසට් මඟින් ප්‍රකාශයට පත්කර නොතිබුණි.

(එ) කුරුදුමලේ (කුරින්දි) පුරාවිද්‍යා ස්ථානයේ නටඹුන් බහුලව විසිරී පැවති අක්කර 229 ක භූමිය ඇතුළත විවිධ කණ්ඩායම් විසින් හෙළි පෙහෙළි කර පැවති භූමිය ඇතුළුව අක්කර 100 ට වැඩි අනවසරයෙන් වනාන්තරය කපන ලද භූමි ප්‍රදේශයේ වගා කටයුතු අත්හිටුවා තිබුණි. කුරින්දි වැව ආසන්නයේ පස් ඉවත් කර පැවති භූමියේ අතීතයේ යකඩ නිස්සාරණ කර්මාන්ත ස්ථාපිතව පැවති බවට නිරීක්ෂණය කළ හැකි යබොර මිශ්‍ර පාංශු සාධක පැතිර තිබුණි. පද්මාකාර හැඩයෙන් යුත් කබොක් ගලින් ඉදිකරන ලද දාගැබ, පිළිමගෙය, බෝධිඝරය, පොකුණ, ප්‍රාකාර බැම්, පොහොයගෙය, ශිලා ලිපිය, ගල් පාලම, පියගැටපෙළ හා නිශ්චිතව සඳහන් කළ නොහැකි ගොඩනැගිලි ව්‍යූහයන් හා ජනාවාස සාධක පැවති අතර, මෙම පුරාවිද්‍යා ස්ථානය සම්බන්ධයෙන් මතු වූ ගැටලුකාරී තත්ත්වය හේතුවෙන් අභියාචනාධිකරණයේ නඩු 07 ක් හා ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු කටයුතු 02 ක් විභාග වෙමින් පවතින බව නිරීක්ෂණය විය. මෙම අක්කර 229 ක භූමිය මැන මායිම් සැලසුම් පිළියෙල කර දෙන ලෙසට 2020 නොවැම්බර් සිට අදාළ රාජ්‍ය ආයතන වෙතින් ඉල්ලීම් කර තිබුණ ද, මෙම කාර්යයන් ඉටුවී නොතිබුණු අතර කැණීම් අවසන් කර පැවති ප්‍රතිමා ගෘහය සංරක්ෂණ කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් පාරිසරික විපර්යාසයන්ට ලක්වී ස්මාරකයන්ට දැඩි හානිකර තත්ත්වයක් පවතින බවට ද නිරීක්ෂණය විය.

3.1.2. ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාද්‍යන්

මහා විහාර භූමිය සම්බන්ධයෙන් ප්‍රධාන ස්මාරක හඳුනා ගැනීම, කැණීම් කර පාදා ගැනීම හා තහවුරු කර ගැනීම යන පුරාවිද්‍යාත්මක මැදිහත්වීම් නිම කර ශ්‍රී මහා බෝධිය, ලෝවාමහාපාය, රුවන්වැලිසෑය, ථූපාරමය මූලික කොටගත් අනෙකුත් ස්මාරකයන් මධ්‍යම සංස්කෘතික අරමුදල මඟින් නඩත්තු කටයුතු පවත්වාගෙන යනු ලබන නමුදු, මෙම ස්මාරකයන් සහිත භූමියේ පැරණි භූ දර්ශනය සකස් කිරීමේ කාල ප්‍රමාදයක් පැවතුණි. අනුරාධපුර පූජා නගරය ගැසට් මඟින් ප්‍රකාශයට පත් කිරීමේදී මහා විහාර භූමිය අක්කර 276 ක් ලෙස හඳුනාගෙන පැවති නමුත්, පැරණි මහා විහාර සීමාව මෙතෙක් නිශ්චිතව හඳුනාගෙන මැනීම් කටයුතු සිදුකර නොතිබුණි. වර්තමානයේ සමස්ථ මහා විහාර ආරාම සංකීර්ණයේ ව්‍යාප්තිය හඳුනාගෙන, එම

භූමිය මැනීම් කටයුතු සිදුකර පුරාවිද්‍යා රක්ෂිත භූමියක් ලෙස ප්‍රකාශයට පත් කිරීමේ අවශ්‍යතාවය දැඩිව පැන නැඟී පැවති කරුණක් බවට නිරීක්ෂණය විය.

3.2. විදේශ ආධාර ව්‍යාපෘති

මහනුවර රජවාසල හා කෞතුකාගාරය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ඇමරිකා එක්සත් ජනපද රජය විසින් ඇමරිකානු ඩොලර් 265,000 ක් වූ ආසන්න වශයෙන් රු.52,997,350 ක් ලබාදීමට ගිවිසුම්ගත වී තිබුණ ද, ව්‍යාපෘතියේ භෞතික කාර්යසාධන තත්ත්වයන් සලකා බලා ඇමරිකා එක්සත් ජනපද රජය මඟින් ලබාදී තිබුණු මුදල ඇමරිකානු ඩොලර් 156,750 ක් වූ ආසන්න වශයෙන් රු.45,940,661.30 ක් පමණක් වූ අතර, වසර දෙකක් වූ මෙම ව්‍යාපෘතියේ ගිවිසුම් කාලය 2024 අගෝස්තු 31 දින දක්වා දීර්ඝ කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට මෙම ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 57 ක් ද, මූල්‍ය ප්‍රගතිය සියයට 21 ක් ද පමණක් වූ අතර, 2023 වර්ෂය සඳහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබූ අක් මුදල් රු.41,879,303.50 කින් සියයට 63 ක් හෙවත් රු.26,788,749.80 ක මුදලක් නැවත භාණ්ඩාගාරයට භරවා යවා තිබුණි. දෙපාර්තමේන්තුවේ දුර්වල කළමනාකරණය මේ සඳහා හේතු වී තිබුණි.

. වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 වර්ෂයේදී අක්‍රීය වී 2016 වර්ෂයේදී රු.128,520 ක් වැය කර අළුත්වැඩියා කර තිබුණු GIS ඒකකය වෙත සිතියම් මුද්‍රණය සඳහා මිලදී ගනු ලැබූ HP වර්ගයේ Desing Jet 800 Ps මාදිලියේ ප්ලොටර් මුද්‍රණ යන්ත්‍රය 2023 ජූලි මස වන විටත් තවදුරටත් අක්‍රීයව නිශ්කාර්ය තත්ත්වයේ පැවතුණු අතර මෙම යන්ත්‍රය මිලදී ගත් කාලය, වියදම පිළිබඳ නිශ්චිත තොරතුරු සොයා ගැනීම අසීරු බවට වාර්තා කර තිබුණි.

(ආ) GIS ඒකකය සතුව පවතින පුරාවිද්‍යා ස්ථාන වල පිහිටීම ලබා ගැනීම සඳහා යොදා ගන්නා GPS යන්ත්‍ර 05 න් 04 ක්ම ක්‍රියාත්මක තත්ත්වයේ නොපැවතීම හේතුවෙන් අදාළ පුරාවිද්‍යා ස්ථාන සඳහා නිවැරදිම GPS බාණ්ඩාංක ලබා ගැනීමේ ගැටලුකාරී තත්ත්වයක් පවතින බව නිරීක්ෂණය විය.

(ඇ) අංක KS – 1862 හා අංක KL – 4294 දරන වාහන ධාවනය කිරීමට නොහැකි බවට යාන්ත්‍රික ඉංජිනේරුවරයා විසින් නිර්දේශ ලබාදී තිබියදී අවශ්‍ය අළුත්වැඩියාවන් සිදුකර නොතිබුණු අතර, යාන්ත්‍රික ඉංජිනේරුවරයාගේ නිර්දේශය ලබා ගැනීමට

ප්‍රමාද වීම හා ආවරණයක් රහිතව ගාල්කර තිබීම හේතුවෙන් නියමිත පිරිවැය ඉක්මවා වියදම් දැරීමට සිදුවන බවට නිරීක්ෂණය විය.

3.4. පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2018 සැප්තැම්බර් 18 දින සිට 2023 ජූලි 19 දක්වා හදිසි අනතුරු වලට භාජනය වූ දෙපාර්තමේන්තුවේ රථ වාහන 10 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 (1) ප්‍රකාරව විධිමත් පරීක්ෂණ සිදු කර අලාභය තක්සේරු කර වගකිව යුත්තන් හඳුනා ගැනීමටත්, මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව පාඩු හා හානි ලේඛනයට ඇතුළත් කිරීමටත් කටයුතු කර නොතිබුණි. තවද, 2023 අප්‍රේල් 12 සිට නොවැම්බර් 18 දක්වා කාලය තුළ හදිසි අනතුරු වලට භාජනය වූ රථ වාහන 06 ක රු.274,000 ක් වූ මුළු අලාභය මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව පරීක්ෂණ කටයුතු අවසන් කර වගකිව යුතු අයගෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට ද කටයුතු කර නොතිබුණි.

(ආ) අත්තනගල්ල ඔයෙන් හමුවී කොළඹ ජාතික කෞතුකාගාර භූමියේ තැන්පත් කර පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙත හිමිකාරීත්වය සහ සංරක්ෂණමය කාර්යය පැවරී තිබුණු අත්තනගල්ල පාරුව නියමිත කාලවකවානුව තුළ යෝග්‍ය සංරක්ෂණ ක්‍රමවේදයන්ට අනුව සංරක්ෂණය නොකිරීම නිසා ඉතා කුඩා දැව කොටස් දක්වා විනාශ වී තිබුණි. විනාශයට භාජනය වූ එහි දැවමය කොටස් තැබීමට 2021 වර්ෂයේදී රු.1,770,876 ක් වැය කර ආධාරකයක් සකස් කර තිබුණ ද, එම දැව කොටස් සංරක්ෂණ සීමා ඉක්මවා තිබීම නිසා එහි සත්‍ය ප්‍රමාණයේ අනුරුවක් සකස් කිරීම සඳහා යළි පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙත ගෙනවිත් රසායනාගාරය තුළ තැන්පත් කර තිබුණි. මෙම පාරුවෙහි සංරක්ෂණ සීමා ඉක්මවා තිබුණ ද, එහි ඇති ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක වැදගත්කම මත එය කිසිසේත්ම අපහරණය කළ නොහැකි බවට ඊට අදාළව විෂයභාර අමාත්‍යාංශය විසින් පත් කරන ලද කමිටුව විසින් ඒකමතිකව තීරණය කර තිබුණු නමුත් එහි සංරක්ෂණ කාර්යයන් සිදු කර නොතිබුණි.

3.5. කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වවුනියාවේ රංකෙත්ගම ගල නම් ස්ථානයේ හා මුලතිව් දිස්ත්‍රික්කයේ ඔඩ්ඩුසුඩාන් වමලන්කුලම රක්ෂිතයෙන් වටවී පැවති වමලන්කුලම නම් ස්ථානයේ ඛනිජ හා පාෂාණ නිස්සාරණ සඳහා පුරාවිද්‍යා නිර්දේශ ලබාදීමේ ලිපියේ සඳහන් කොන්දේසි වලට අනුව, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ විශේෂ අනුමැතියක් ලබා නොගෙන අඩි

50 ක පමණ විශාල ගැඹුරකට ගල් කඩා ඉවත් කර අතහැර දමා පැවති ස්ථාන ජලයෙන් පිරී පැවතුණු නමුත්, ඊට එරෙහිව නීතිමය පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, රංකෙත්ගම යෝජිත ස්ථානය හා ඒ අවට මීටර් 50 ක ප්‍රදේශයක් තුළ පොළොව මතුපිට පමණක් පාදක කරගනිමින් සිදුකර පැවති නිරීක්ෂණ මත ඓතිහාසික හෝ පුරාවිද්‍යාත්මක සාධක දක්නට නොලැබුණු බව නිගමන හා යෝජනා වල සඳහන් කර තිබුණ ද, යාබඳ ගල්තලාවෙහි පුරා සාධක පැවති බව ක්ෂේත්‍ර පරීක්ෂණයේදී නිරීක්ෂණය විය.

(ආ) 2008 ජූනි 06 දිනැති අංක 1553 දරන ගැසට් පත්‍රය මඟින් ආරක්ෂිත ස්මාරකයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇති තෝනිගල පුරාවිද්‍යාත්මක ස්ථානය විස්තීර්ණ ගවේෂණයක් මඟින් සමස්ත භූමි ප්‍රමාණය හඳුනාගෙන අදාළ මිනුම් කටයුතු සිදුකර පුරාවිද්‍යා රක්ෂිතයක් ලෙස ගැසට් මඟින් ප්‍රකාශයට පත් කිරීමට කටයුතු සිදුකර නොතිබුණු අතර, මෙම ස්ථානය මහජන ප්‍රදර්ශනය සඳහා විවෘත කිරීමේ අරමුණින් අත්‍යාවශ්‍ය ඉදිකිරීම් සඳහා වූ 2022 ස්ථානීය සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) ශිලා මංජුසා වර්ගයට අයත් මහාශිලා සුසාන භූමියක් වන අක්කර 26 ක පමණ ප්‍රදේශයක පුරාවිද්‍යා නටඹුන් විසිරී පැවති වවුනියාව දිස්ත්‍රික්කයේ වවුනියාව දකුණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අග්බෝපුර ග්‍රාම නිලධාරී වසමේ මාමඩුව ග්‍රාමයේ පිහිටා ඇති මාමඩුව මූල ඓතිහාසික සොහොන් බිම පුරාවිද්‍යා ස්ථානය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පුරාවිද්‍යා නිර්දේශ ලබා ගැනීමෙන් තොරව වනවගා කටයුතු කිරීම හේතුවෙන් පුරාසාධකවලට හානි සිදුවී පැවති අතර, දැඩි ලෙස හානි වීමෙන් අනතුරුව 2022 ජූලි 28 දින අංක 2290/33 දරන ගැසට් පත්‍රය මඟින් පුරාවිද්‍යා රක්ෂිතයක් ලෙස ප්‍රකාශයට පත්කර තිබුණි.

(ඈ) පෘතුගීසින් විසින් ඉදිකර පසුව ලන්දේසින් විසින් ප්‍රතිසංස්කරණය කර ඇති බවට මූලාශ්‍ර සාධක පවතින මන්නාරම් දිස්ත්‍රික්කයේ මුසලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අරිප්පු නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමේ මුක්කරිපුත්තුරය ග්‍රාමයේ පිහිටා ඇති හෙක්ටයාර 0.4465 ක භූමි ප්‍රදේශයක් පුරා විසිරී ඇති අරිප්පු බලකොටුව 2013 අගෝස්තු 16 දිනැති අංක 1823/73 දරන ගැසට් පත්‍රය මඟින් පැරණි / ආරක්ෂිත ස්මාරකයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇති නමුත්, එහි කිසිදු පුරාවිද්‍යාත්මක කාර්යයක් සිදුකර නොතිබුණු අතර, සංචාරක ආකර්ෂණය දිනාගත හැකි වන පරිදි සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම කෙරෙහි ද දෙපාර්තමේන්තුවේ අවධානය යොමු වී නොතිබුණි.

(ඉ) මන්නාරම් දිස්ත්‍රික්කයේ නානට්ටාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මුරුංකන් ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මුරුංකන් රෝහල් භූමියේ පිහිටා ඇති දිගින් සෙ.මී. 160 ක් හා

පළලින් සෙ.මී 61 ක් වූ පුවරු ලිපිය ක්‍රි.ව. 2-3 සියවස් වලට අයත් යැයි සැලකෙන අතර, එහි ගෙවී ගොස් ඇති අපරබ්‍රාහ්මීය අක්ෂර දක්නට ලැබෙන පුවරු ලිපිය 2014 ජූනි 20 දිනැති අංක 1868 දරන ගැසට් පත්‍රය මඟින් පැරණි/ ආරක්ෂිත ස්මාරකයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති නමුත්, රෝහල් සේවකයන් විසින් එය අසුන් ගැනීම සඳහා භාවිතා කිරීම හේතුවෙන් අනාරක්ෂිතව අක්ෂර මැකී ගොස් පැවති බවට නිරීක්ෂණය විය

(ඊ) 1967 අගෝස්තු 25 දිනැති අංක 14763 දරන ගැසට් පත්‍රය මඟින් අක්කර 03 යි රූඩ් 0 පර්චස් 33.8 ක භූමි ප්‍රදේශයක වෙන් කර ඇති 2014 ජූනි 20 දිනැති අංක 1868 දරන ගැසට් පත්‍රයෙ මඟින් ආරක්ෂිත ස්ථානයක් ලෙස ප්‍රකාශයට පත්කර තිබුණු කන්දරෝඩේ (කඳුරුගොඩ) පුරාවිද්‍යා ස්ථානය සඳහා යාර 400 සීමාව නොතකමින් පෞද්ගලික පදිංචිකරුවන් විසින් ක්‍රමයෙන් මෙම පුරාවිද්‍යා ස්මාරක සහිත සීමාව දක්වා වූ ඉඩම් අත්පත් කරගනිමින් පැවති අතර, මෙහි කුඩා ස්ථූප පවතින පරිශ්‍රයෙහි වැසි වතුර පිරී යාම හේතුවෙන් භායනයට ලක්වන සංරක්ෂිත ස්ථූප කොටස් සහිත පරිශ්‍රයේ වැසි වතුර බැස යාමට නළ පද්ධතියක් එළීම සඳහා 2016 වර්ෂයේදී ඉදිරිපත් කළ රු.534,150 ක ඇස්තමේන්තුව මත රු.67,000 ක මුදලක් වැය කරමින් මිලදීගෙන තිබූ හියුම් පයිප්ප නිශ්කාර්යයව පරිශ්‍රයේ ගොඩ ගසා තිබුණි.

(උ) බාහිර පාර්ශවයන් වෙත කැණීම් බලපත්‍ර නිකුත් කිරීම යටතේ 2023 ජූනි 30 දිනට ලැබිය යුතු අවසන් ශාස්ත්‍රීය වාර්තා සංඛ්‍යාව 53 ක් වූ අතර, එයින් වසර 10 ඉක්මවූ කැණීම් බලපත්‍ර සංඛ්‍යාව 07 ක් සහ වසර 05 ඉක්මවූ කැණීම් බලපත්‍ර සංඛ්‍යාව 15 ක් විය.

(ඌ) කැණීම් කාර්ය පටිපාටියේ 6.1.3 වගන්තිය ප්‍රකාරව 2022 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුව යටතේ පවතින පුරාවිද්‍යා කෞතුකාගාර 13 ක කෞතුක භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීමටත්, කැණීම් කාර්ය පටිපාටියේ 7.1 වගන්තිය ප්‍රකාරව 2022 වර්ෂය සඳහා වාර්ෂික පාලන වාර්තාව පිළියෙල කිරීමටත් කටයුතු කර නොතිබුණි.

(එ) ස්ථාවර නියෝගයේ සඳහන් කැණීම් මාර්ගෝපදේශ 03 හි 16 වන වගන්තිය සහ කැණීම් කාර්ය පටිපාටියේ 2.1.2.2 වගන්තිය ප්‍රකාරව, පසුගිය කැණීම් වාර්තා සම්පූර්ණ නොකරන ලද පුද්ගලයෙකුට කැණීම් කටයුතු සඳහා නැවත නව බලපත්‍රයක් නිකුත් නොකළ යුතු වුවද, පසුගිය කැණීම් වාර්තා ලබා නොදුන් පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මහාචාර්යවරුන් දෙදෙනෙකුට නැවත කැණීම් බලපත්‍ර නිකුත් කර තිබූ අතර 2006 සිට 2017 දක්වා කැණීම් බලපත්‍ර 08 කට අවසාන ශාස්ත්‍රීය වාර්තා ඉදිරිපත් කර නොමැති නමුත් 2022 දක්වා නව කැණීම් බලපත්‍ර 14 ක් ද නිකුත් කර තිබුණි. එසේම ථූපාරාම පිළිමගෙය, විජයරාම පිළිමගෙය හා කිරිබත්වෙහෙර යන

ස්ථාන කැණීම් සඳහා ලබාදුන් බලපත්‍ර යටතේ වාර්තා භාරදීමේ කාලයද ඉකුත් වී තිබුණි.

(ඒ) දෙපාර්තමේන්තු ගවේෂණ හා ලේඛනගත කිරීම් අංශය තුළ ක්‍රියාත්මක වන කාර්ය පටිපාටියේ 02 වන වගන්තිය ප්‍රකාරව වංචල පුරාවස්තු ලේඛනගත කිරීම සඳහා ක්‍රමවත් සමීක්ෂණයක් සිදුකර පුරාවස්තු හඳුනා ගැනීම, මහජන ප්‍රදර්ශනය සඳහා යොමු කිරීම හෝ වෙනත් විකල්ප ක්‍රියාමාර්ග කෙරෙහි අවධානය යොමු නොකිරීම මත බොහෝ පුරාවස්තු කාලීනව විනාශ වෙමින් පැවති බව නිරීක්ෂණය වූ අතර, දෙපාර්තමේන්තු කැණීම්, අනවසර කැණීම් හා මහජන ආධාර යටතේ හඳුනාගත් පුරාවස්තු විශාල ප්‍රමාණයක් හම්බන්තොට හා කැගල්ල පුරාවිද්‍යා කාර්යාල පරිශ්‍රයේ ගොඩ ගසා තිබුණි.

කාර්ය පටිපාටි සංග්‍රහයේ වගන්ති අංක 1.2.22 ප්‍රකාරව 2020 වර්ෂයෙන් පසුව දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කළ ගවේෂණ ව්‍යාපෘති 18 ක් සඳහා ගවේෂණ වාර්තා ලබාදී ඇති නමුත්, GIS ඒකකය වෙත රැස්කරගත් දත්ත ලබා දීමට ද කටයුතු කර නොතිබුණි.

(ඕ) දෙපාර්තමේන්තුව විසින් 2023 වර්ෂය දක්වා හඳුනාගත් පුරාවිද්‍යා ස්ථාන සංඛ්‍යාව 5,664 ක් විය. ඒ අතරින් 2023 දෙසැම්බර් 31 දිනට ජාතික පුරාවිද්‍යා ස්ථාන නාමාවලිය තුළ ගැසට් මඟින් ප්‍රකාශයට පත්කර තිබූ සමස්ථ පුරාවිද්‍යා ස්ථාන සංඛ්‍යාව 2,958 ක් වූ අතර, දෙපාර්තමේන්තු වෙබ් අඩවිය තුළ ඇතුළත් භූ අවකාශීය දත්ත ගොනුවට ඇතුළත් කර තිබූ පුරාවිද්‍යා ස්ථාන ගණන 1,758 ක් විය. ඒ අනුව 2023 දෙසැම්බර් 31 දිනට හඳුනාගත් සමස්ථ පුරාවිද්‍යා ස්ථාන වලින් සියයට 48 ක් ගැසට් මඟින් ප්‍රකාශයට පත්කර නොතිබූ අතර, සියයට 69 ක භූගෝලීය ස්ථාන ක්‍රමාංකන දත්ත ලබාගෙන ඒවා භූ අවකාශීය දත්ත ගොනුවට ඇතුළත් කර නොතිබුණි.

(ක) 2018 ඔක්තෝබර් 09 දින මධ්‍යම ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලයට අයත් ඩබල් කැබ රථයේ සිදු වූ අනතුර සම්බන්ධයෙන් චිත්තිකරු වූ එම රථයෙහි රියදුරුට රු.46,500 ක දඩ මුදලක් නියම කර තිබුණ ද, රථයට සිදු වූ අලාභය වූ රු.5,882,769 ක් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කර අයකර ගැනීමටත් වසර 05 කට අධික කාලයක් නිස්සේ රථය අළුත්වැඩියා කිරීමටත් කටයුතු කර නොතිබුණි.

(ග) යාන්ඔය වාරිමාර්ග ජලාශ ව්‍යාපෘතියේ, පුරාවිද්‍යා හානි ඇගයීම් සමීක්ෂණ වාර්තා ලබා ගැනීම සඳහා 2017 පෙබරවාරි 14 දින පොදු තැන්පත් ගිණුමේ තැන්පත් කර පැවති මුදලින් රු.2,105,152 ක මුදලක් තවදුරටත් පොදු තැන්පත් ගිණුම තුළ රඳවාගෙන පවතින බව නිරීක්ෂණය විය.

(ව) දීඝවාපී දාගැබ ප්‍රතිනිර්මාණය කිරීමේ කාර්යය සඳහා Rotatable arched template එකක් රු.4,147,400 කට නිෂ්පාදනය කරවා ගැනීම පිණිස රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවට රු.2,239,596 ක අත්තිකාරම් මුදලක් 2020 අගෝස්තු 25 දින ලබාදී, පසුව එම කාර්යය ආරක්ෂක අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කිරීම හේතුවෙන් එය මිනුම් උපකරණ මඟින් මිනුම් ලබා ගැනීමේ ක්‍රමවේදය අනුව සිදු කිරීමට තීරණය කර තිබුණි. ගෙවා ඇති අත්තිකාරම් මුදලින් සකස් කර පැවති යකඩ කොටස්, වෛද්‍ය ඉදිකිරීමෙන් පසු අවශ්‍ය නඩත්තු කාර්යයන් සඳහා ප්‍රයෝජනයට ගත හැකි වන පරිදි ගලවා ඉවත් කළ හැකි තරප්පු පෙළක් නිම කිරීම සඳහා භාවිතා කිරීමට යෝජනා කර තිබුණත්, ඒ අනුව කටයුතු සිදුකර නොතිබුණි.

(ශ) රජය විසින් වාර්ෂිකව නඩත්තු වියදම් දරමින් A, B, C ලෙස ශ්‍රේණි වර්ගීකරණය යටතේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් දිවයින පුරා කෞතුකාගාර 28 ක් පවත්වාගෙන යනු ලැබුව ද, ඉන් ත්‍රිකුණාමලය සමුද්‍ර හා නාවික ඉතිහාස කෞතුකාගාරය මඟින් පමණක් ගාස්තු අයකිරීමේ ක්‍රමවේදය අනුගමනය කිරීමත්, අනෙකුත් කෞතුකාගාර නරඹන්නන්ගෙන් ගාස්තු අය නොකිරීමත් නිසා ලබාගත හැකිව තිබූ ආදායම් අහිමි වී තිබුණි.

(ට) මිනිසාගේ අතීතය සොයා, හෙළ ජනයාගේ දේශීය ආහාර රටාව, මානව විද්‍යාව, අපේ හෙළයෝ ගලින් කළ විස්කම්, බිතු සිතුවම් සංරක්ෂණය, සුළු නොවන සුළු කලා යන ග්‍රන්ථ පිටපත් 2,000 ක් බැගින් ද, පුරාවිද්‍යා ස්ථාන නාමාවලිය රත්නපුර ග්‍රන්ථයෙන් පිටපත් 1,000 ක් සහ Proceeding of the National Archeology Symposium යන ග්‍රන්ථයෙන් පිටපත් 100 ක් 2023 දෙසැම්බර් මස රු.3,732,210 ක් ගෙවා මුද්‍රණය කරවාගෙන තිබුණු අතර ප්‍රතිපාදිත මුදල ඉක්මවීම මත ඒ සඳහා රු.1,632,210 ක සැලසුම් කළ ව්‍යාපෘති 02 ක් යටපත් කර තිබුණි. මෙලෙස මුද්‍රණය කරන ලද පොත් අලෙවි කිරීමට හෝ බෙදාහැරීමට නිසි සැලසුම් සහගත වැඩපිළිවෙලක් නොමැති වීම හේතුවෙන් ග්‍රන්ථ 12,380 ක් පමණ දෙපාර්තමේන්තු පරිශ්‍රයේ සවිකර ඇති කන්ටේනර් බහාලුම් දෙකෙහි නිශ්කාර්යව ගබඩා කර පැවති බවට 2024 මාර්තු 27 දින සිදුකරන ලද පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ඩ) වාහන අපහරණය සඳහා වන විශේෂ සමීක්ෂණ මණ්ඩලය විසින් වාහන 04 ක් අපහරණය කිරීම සඳහා 2023 අගෝස්තු 11 දිනැතිව නිර්දේශය ඉදිරිපත් කර තිබුණ ද, 2024 මාර්තු 28 දින දක්වාම එම නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

(ණ) පුරාවස්තු පනත උල්ලංඝනය කිරීම යටතේ සමාලෝචිත වර්ෂයේ පුරාවස්තු සොරකම් කිරීම්, පුරාවස්තු විනාශ කිරීම් හා අනවසර කැණීම් 179 කින් අදාළ සැකකරුවන් හඳුනා නොගත් අවස්ථා 12 ක් ද, සැකකරුවන් හඳුනාගත් නමුත්, නඩු පැවරීම් සිදු නොකළ අවස්ථා 64 ක් ද පවතින බව නිරීක්ෂණය විය. තවද, 1998 අංක 24 දරන පුරාවස්තු සංශෝධන පනතින් සංශෝධනය වූ 1940 අංක 09 දරන පුරාවස්තු ආඥා

පනතේ 46 (1) අනුව නීති කෙටුම්පත් සම්පාදනය හා ක්‍රියාත්මක වීමේ ප්‍රමාදය හේතුවෙන්, සමාලෝචිත වර්ෂය තුළ අයකර ඇති මුදල රු.130,479,050 ක් වූ අධිකරණ දඩ මුදලින් අඩක්, පුරාවිද්‍යා තැගි අරමුදලට බැර කොට නියමිත කාර්යයන් ඉටු කිරීමට නොහැකි වී තිබුණි.

(ත) ඛනිජ හා පාෂාණ නිස්සාරණය සඳහා පුරාවිද්‍යා නිර්දේශය ලබාදීමේදී අය කෙරෙන ගාස්තු 2019 පෙබරවාරි 25 දින සිට ක්‍රියාත්මක වන පරිදි අයකරන ගාස්තුව රු.10,000 ක් ලෙස සංශෝධනය කර එම ගාස්තුව ඉදිරියේදී වර්ෂ 03 කට වරක් සංශෝධනය කළ යුතු බවට රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2019 පෙබරවාරි 28 දිනැති ලිපිය මඟින් උපදෙස් ලබාදී තිබුණු අතර 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 (II) කොටසෙහි ඡේද අංක 05 ප්‍රකාරව වසර 03 කට වරක් සියයට 15 ක උපරිමයකට යටත්ව ගාස්තු සංශෝධනය කළ යුතු විය. එසේ වුවද, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් ඒ ආකාරයට ගාස්තුව සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබීමෙන් රජයට අයවිය යුතු ආදායම් අහිමි වී තිබුණි. දෙපාර්තමේන්තුව විසින් තාවකාලිකව බදු දී ඇති මාතර මහනගර සීමාව තුළ පිහිටි නූපේ පැරණි ඕලන්ද වෙළඳපොළ ගොඩනැඟිලි සංකීර්ණය සඳහා ද චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව ගාස්තු සංශෝධනය කිරීමට කටයුතු නොකර රු.5,000 ක ප්‍රමාණවත් නොවන ගාස්තුවකට බදු දී තිබුණි.

4. මානව සම්පත් කළමනාකරණය

4.1. අනුයුක්ත කාර්ය මණ්ඩලය, තත්‍ය කාර්ය මණ්ඩලය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2023 දෙසැම්බර් 31 දිනට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ 4,317 ක් වූ අනුමත සමස්ථ කාර්ය මණ්ඩලයෙන් 1,660 ක් හෙවත් සියයට 38 ක් පුරප්පාඩු වූ අතර, ඒ තුළ වසර 15 කට වැඩි කාලයක් පුරප්පාඩු වී පවතින දෙපාර්තමේන්තුවට පමණක් ආවේණික වූ ශාස්ත්‍රීය කටයුතු සඳහා විධායක මට්ටමේ අධ්‍යක්ෂ තනතුරු 08 ක් ද, දෙපාර්තමේන්තුවේ නීති නිලධාරී තනතුර ද ඇතුළත් විය.

(ආ) දෙපාර්තමේන්තුව සඳහා අනුමත සංවර්ධන නිලධාරී තනතුරු සංඛ්‍යාව 250 ක් වුවද, 2023 දෙසැම්බර් 31 දිනට සේවයේ නියුතු තත්‍ය සංඛ්‍යාව 285 ක් වූයෙන් 35 දෙනෙකුගෙන් අතිරික්තයක් පැවති අතර, අනුමත තනතුරු සංඛ්‍යාව සංශෝධනය කර ගැනීමට හෝ ඔවුන් ඒකාබද්ධ සේවාව සඳහා නිදහස් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) පුරාවිද්‍යා සහායක තනතුර සඳහා 688 දෙනෙකු, මුරකරු තනතුරු සඳහා 201 දෙනෙකු හා රියදුරු තනතුර සඳහා දෙදෙනෙකු වශයෙන් දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික මට්ටමේ තනතුරුවල පවතින පුරප්පාඩු පිරවීම සඳහා 2023 වර්ෂයේදී බඳවාගත් බහුකාර්ය සංවර්ධන කාර්ය සහායක පුහුණුලාභීන් ප්‍රාදේශීය කාර්යාල සඳහා යෝජිත සැලසුම්ගත සංඛ්‍යාවට වඩා වැඩියෙන් සේවා අවශ්‍යතාවය නොසලකා අනුයුක්ත කර තිබුණු බවට නිරීක්ෂණය විය.

ආර්.එම්.එස්.එස්. පෙරේරා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

04. පරිච්ඡේදය

කාර්යසාධන දර්ශකය

4.1. ආයතනයේ කාර්යසාධන දර්ශකය (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශකය		අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100% - 90%	**75% - 89%**	**50% - 74%**
1	සංරක්ෂණය කරන ලද ගොඩනැගිලි ඒකක ගණන		√	
2	ගවේෂණය කරන ලද පුරාවිද්‍යා ස්ථාන ගණන	√		
3	නඩත්තු කර පවත්වා ගෙන යන ස්ථාන සහ ස්මාරක වැඩ බිම් ඒකක ගණන	√		

05.පරිච්ඡේදය

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1. හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

11.4 රටේ ස්වාභාවික හා සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීම හා ආරක්ෂා කර ගැනීම සඳහා වූ ප්‍රයත්නයන් ශක්තිමත් කිරීම.

11.4.1 ප්‍රධාන කාර්ය සාධක දර්ශක

1. සංරක්ෂණය කරන ලද ගොඩනැගිලි ඒකක ගණන.
2. ගවේෂණය කරන ලද පුරාවිද්‍යා ස්ථාන ගණන.
3. නඩත්තු කර පවත්වාගෙන යන ස්ථාන සහ ස්මාරක වැඩ බිම් ඒකක ගණන.

ඉලක්කය / අරමුණ	ඉලක්ක		ජයග්‍රහන දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය.		
				0% - 49%	50% - 74%	75% - 100%
රටේ ස්වාභාවික හා සංස්කෘතික උරුමයන් ආරක්ෂා කර ගැනීම හා ආරක්ෂා කර ගැනීම සඳහා වූ ප්‍රයත්නයන් ශක්තිමත් කිරීම.	**1.1**	**විශ්වීය වැදගත්කමක් ඇති පුරාවිද්‍යා ස්ථාන ලෝක උරුම තත්ත්වයට උත්ශ්‍රේණි කිරීම.**				
	1.1.1	2030 වන විට පුරාවිද්‍යා ස්ථානයක් ලෝක උරුමයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම.	පුරාවිද්‍යා ස්ථාන ගණන	මෙහි කටයුතු සිදු කරමින් පවතී.		
	1.2	**පුරාවිද්‍යා ස්ථාන නියමු සැලසුම් තුළ හඳුනා ගෙන ඇති වැඩසටහන් තුළින් ප්‍රශස්ත මට්ටමට ගැනීම.**				
	1.2.1	නියමු සැලසුම් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම - (වර්ෂයකට 05)	පුරාවිද්‍යා ස්ථාන ගණන		√	
	1.3	**ගවේෂණය කිරීම / ගැසට් කරනු ලබන පැරණි පුරාවිද්‍යා ස්මාරක සහ ස්ථාන වැඩි කිරීම.**				
	1.3.1	ආරක්ෂිත ස්මාරක සහ රක්ෂිත ප්‍රකාශයට පත් කිරීම				
		(i.) ආරක්ෂිත ස්මාරක වර්ෂයකට 100	ආරක්ෂිත ස්මාරක ගණන			√
		(ii.) වෙන් කළ ප්‍රදේශ වසරකට 25	රක්ෂිත ගණන		√	
	1.3.2	උරුම කළමනාකරණය සඳහා නිවැරදි අවකාශීය දත්ත රැස්කිරීම.	රැස් කරන දත්ත ප්‍රතිශතය		√	
	1.3.3	පුරාවිද්‍යා ස්ථාන නාමාවලිය ප්‍රකාශයට පත් කිරීම.	ප්‍රකාශිත පුරාවිද්‍යා ස්ථාන		√	
	1.3.4	දෛනික ක්ෂේත්‍ර කටයුතු සිදු කිරීම.	ගවේෂණ කරන ලද ස්ථාන			√
	1.3.5	වංචල පුරාවස්තු ලේඛනගත කිරීම.	ලේඛනගත කරන ලද පුරාවස්තු		√	

ඉලක්කය / අරමුණ	ඉලක්ක		ජයග්‍රහන දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය.		
				0%-49%	50% - 74%	75% - 100%
11.4 රටේ ස්වාභාවික හා සංස්කෘතික උරුමයන් ආරක්ෂා කර ගැනීම හා ආරක්ෂා කර ගැනීම සඳහා වූ ප්‍රයත්නයන් ශක්තිමත් කිරීම.	**1.4**	**ප්‍රජාව, පාසැල් සහ විශ්වවිද්‍යාල ළමුන්ගේ සහභාගිත්වයෙන් ස්ථාන ආශ්‍රිත ක්‍රියාකාරකම් සංවිධානය කිරීම.**				
	1.4.1	ස්ථානීය දැනුවත් කිරීමේ වැඩමුළු - (ස්ථාන ගණන වසරකට 15)	පැවැත්වූ වැඩමුළු			√
	1.4.2	පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ හා අධ්‍යාපන ආයතන සඳහා පුරාකුටි පිහිටු වීම.	පුරාකුටි සංඛ්‍යාව			
	1.4.3	පාසැල් හා විශ්වවිද්‍යාලවලට පුරාවිද්‍යා ස්ථාන රැකබලා ගැනීමට බාරදීම - (වසරකට 60)	ස්ථාන සංඛ්‍යාව	√		
	1.4.4	ශ්‍රමදාන පැවැත්වීම - (වසරකට 30)	පැවැත් වූ ශ්‍රමදාන			√
	1.5	**දෙස් විදෙස් ජනතාව දැනුවත් කිරීම සඳහා වැඩසටහන්.**				
	1.5.1	ජංගම ප්‍රදර්ශන පැවැත්වීම - (වසරකට 30)	පැවැත්වූ ප්‍රදර්ශන		√	
	1.5.2	ග්‍රන්ථ මුද්‍රණය - (වසරකට 10)	මුද්‍රණය කළ ග්‍රන්ථ		√	
	1.5.3	දේශන පැවැත් වීම - (වසරකට 100)	පැවැත් වූ දේශන			√
	1.5.4	වීඩියෝ වැඩසටහන් සකස් කිරීම - (වසරකට 25)	සකස් කළ වීඩියෝ වැඩ සටහන්			√
	1.5.5	සන්නිවේදන කටයුතු ප්‍රවර්ධනය.	වැඩ සටහන් සංඛ්‍යාව			
	1.5.6	පුස්තකාලවලට ග්‍රන්ථ මිලදී ගැනීම - (වසරකට 200)	මිලදී ගත් ග්‍රන්ථ			
	1.5.7	කෞතුකාගාර 28 ක් නඩත්තු කර පවත්වා ගෙන යාම.	නඩත්තු කරන ලද කෞතුකාගාර			√
	1.5.8	සංචාරක මඟ පෙන්වන්නන්ගේ දැනුම වැඩි කිරීම. (සංචාරක මණ්ඩලයේ ඉල්ලීම් අනුව සම්පත් දායකත්වය සැපයීම)	වැඩ සටහන් සංඛ්‍යාව			

ඉලක්කය / අරමුණ	ඉලක්ක		ජයග්‍රහන දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය.		
				0%-49%	50% - 74%	75% - 100%
11.4 රටේ ස්වාභාවික හා සංස්කෘතික උරුමයන් ආරක්ෂා කර ගැනීම හා ආරක්ෂා කර ගැනීම සඳහා වූ ප්‍රයත්නයන් ශක්තිමත් කිරීම. .	**1.6**	**පුරාවස්තු ස්ථාන හා ස්මාරක නඩත්තු කිරීම. (වසරකට 200 පමණ)**				
	1.6.1	පුරාවිද්‍යා ස්ථාන සහ ස්මාරක ආරක්ෂා කිරීම සහ ප්‍රදර්ශනාත්මක මට්ටමින් පවත්වා ගෙන යාම - කලාප 99 (වැඩබිම් 200 පමණ).	නඩත්තු කරන ලද ස්මාරක			√
	1.6.2	පුරාවිද්‍යා ස්මාරක නඩත්තු කිරීම - (වසරට 50)	ප්‍රතිසංස්කරණය කළ ස්මාරක			√
	1.6.3	මායිම් කණු යෙදීම.	මායිම් කණු යෙදූ ස්ථාන සංඛ්‍යාව			√
	1.6.4	පුරාවිද්‍යා ස්ථාන ප්‍රවර්ධනය සඳහා විස්තර පුවරු, මාර්ගෝපදේශ පුවරු, ආරක්ෂිත ස්මාරක පුවරු, අනතුරු ඇඟයීමේ පුවරු සවි කිරීම - (වසරකට 200)	යෙදූ පුවරු සංඛ්‍යාව			√
	1.6.5	පුරාවිද්‍යා ස්ථාන සඳහා සනිපාරක්ෂක සහ යටිතල පහසුකම් සැපයීම - (වසරකට 05)	ස්ථාන සංඛ්‍යාව			√
	1.6.6	විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ට අවශ්‍ය පහසුකම් සැලසීම.	ස්ථාන සංඛ්‍යාව		√	
	1.6.7	කලාප 99 ක් නඩත්තු කිරීම සඳහා උපකරණ මිලදී ගැනීම.	මිලදී ගත් උපකරණ		√	
	1.6.8	රජගලතැන්න පුරාවිද්‍යා ස්ථානය නඩත්තු කර පවත්වා ගෙන යාම	නඩත්තු කරන ලද ස්මාරක			√
	1.7	**පුරාවිද්‍යා පර්යේෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.**				
	1.7.1	කැණීම් - (වසරකට 10)	ක්‍රියාත්මක ව්‍යාපෘති ගණන			√
	1.7.2	ක්ෂේත්‍ර ගවේෂණ හා ලේඛණගත කිරීම් - (වසරකට 20)	ක්‍රියාත්මක ව්‍යාපෘති ගණන			√
	1.7.3	අභිලේඛණ හා නාණක විද්‍යා - (වසරකට 10)	ක්‍රියාත්මක ව්‍යාපෘති ගණන			√
	1.8	**දෙපාර්තමේන්තු යටිතල පහසුකම් - (ස්ථාන, කළමනාකරණ, භෞතික සම්පත්, ගොඩනැගිලි, කාර්යාල මෙවලම්)**				
	1.8.1	නව රසායනාගාර ඉදිකිරීම - (වසරකට 1)	ඉදිකළ රසායනාගාර			
	1.8.2	පැරණි රසායනාගාර නවීකරණය කිරීම.	නවීකරණය කළ රසායනාගාර			

ඉලක්කය / අරමුණ	ඉලක්ක		ජයග්‍රහන දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය.		
				0%-49%	50% - 74%	75% - 100%
11.4 රටේ ස්වාභාවික හා සංස්කෘතික උරුමයන් ආරක්ෂා කර ගැනීම හා ආරක්ෂා කර ගැනීම සඳහා වූ ප්‍රයත්නයන් ශක්තිමත් කිරීම.	1.8.3	නිල නිවාස 1 නඩත්තු කිරීම හා නිලධාරීන් සඳහා නව නිල නිවාස ඉදිකිරීම.	නඩත්තු කරන ලද නිල නිවාස		√	
	1.8.4	කාර්යාල ගබඩා පහසුකම් හා නව කලාප කාර්යාල ඉදිකිරීම - (වසරකට 3)	ඉදිකරන ලද කලාප කාර්යාල			√
	1.8.5	වෙනත් - ප්‍රධාන කාර්යාලය, ප්‍රාදේශීය කාර්යාල, සංචාරක බංගලා, කෞතුකාගාර අන්තර්ගතව ගොඩනැගිලි 100 ක් නඩත්තු කර පවත්වා ගෙන යාම.	නඩත්තු කරන ලද ගොඩනැගිලි			√
	1.8.6	සියලුම සංචාරක බංගලා (15) සඳහා පහසුකම් සැපයීම.	සංචාරක බංගලා සංඛ්‍යාව			√
	1.8.7	නව සංචාරක බංගලා ඉදිකිරීම - (යාපනය, කතරගම, පඩුවස්නුවර)	නව සංචාරක බංගලා			
	1.9	**පුරාවිද්‍යා ස්ථාන සහ ස්මාරක සංරක්ෂණය.**				
	1.9.1	වාස්තු විද්‍යා සංරක්ෂණ - (වසරකට 50)	සංරක්ෂිත ස්මාරක ගණන		√	
	1.9.2	රිටිගල පුරාවිද්‍යා ස්ථානය සංරක්ෂණය - (බන්දා පොකුණ	සංරක්ෂණය කරන ලද ප්‍රතිශතය			√
	1.9.3	රසායන සංරක්ෂණ - (වසරකට 50)	සංරක්ෂණය කරන ලද ස්මාරක		√	
	1.10	**පුරාවස්තු අඥාපනත සංශෝධනය කිරීම**	පනතට සිදු කරන ලද සංශෝධන			√

5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

ආරක්ෂිත ස්මාරක හා පුරාවිද්‍යා රක්ෂිත ප්‍රකාශයට පත් කිරීම, ශාස්ත්‍රීය ගවේෂණ හා පර්යේෂණ සිදු කිරීම, පුරාවිද්‍යාත්මක උරුමය කළමනාකරණය සඳහා නිවැරදි අවකාශීය දත්ත රැස් කිරීම හා භූගෝලීය දත්ත ගොනු සැකසීම, පුරාවිද්‍යාත්මක උරුමයන් ලේඛනගත කිරීම, GIS අන්තර්ජාල බිහිදොර යාවත් කාලීන කිරීම, පුරාවිද්‍යා ස්ථාන හා ස්මාරක / චංචල පුරාවස්තු සංරක්ෂණය හා නඩත්තු කර පවත්වාගෙන යාම, ප්‍රජා සහභාගිත්වයෙන් ශ්‍රමදාන පැවැත්වීම, පාරිසරික අංග සහ භූ දර්ශනය සැකසීම හා පුරාවිද්‍යා ස්ථාන ප්‍රදර්ශනාත්මක මට්ටමින් පවත්වා ගෙන යාම, පුරාවිද්‍යාත්මක ස්ථාන හා ස්මාරක ප්‍රවර්ධනය සහ මහජන ප්‍රදර්ශනය යන වැඩසටහන් යටතේ ව්‍යාපෘති ක්‍රියාවට නංවමින් ශ්‍රී ලාංකීය පුරාවිද්‍යාත්මක උරුමය කළමනාකරණය කිරීමේ ප්‍රධාන නියාමන ආයතනය වශයෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සැලකිය යුතු කාර්යභාරයක් 2023 වර්ෂය තුළ සිදු කර ඇත.

06.පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය 2023.12.31 දිනට

තනතුරු කාණ්ඩය	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබැර්තු / (අතිරික්ත)
විධායක	54	12	42
තෘතීයික	56	34	22
ද්විතියික	782	611	201
ප්‍රාථමික	3424	2000	1421
එකතුව	**4316**	**2657**	**1686**

6.2. ** ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න

- පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත සේවා ගණයේ නිලධාරීන් පිරිසක් විසින් විධායක සේවා ගණයේ (SL-1) බඳවා ගැනීම් පටිපාටිය සඳහා ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් කඩවීමක් සම්බන්ධයෙන් ගොනු කර ඇති අංක SC(FR) 248/2016 නඩුවෙහි තීන්දුව ලබා නොදීම හා බඳවා ගැනීම් පටිපාටිය අනුව බඳවා ගැනීම් සිදු කළ නොහැකි වීම හේතුවෙන් දෙපාර්තමේන්තුගත විධායක මට්ටමේ තනතුරු සියල්ල පුරප්පාඩුව පවතින අතර, තාවකාලික පිළියමක් ලෙස රාජකාරී ඉටු කිරීම/ වැඩ ආවරණය කිරීමේ පදනමින් ඊට පහළ මට්ටමේ නිලධාරීන් සේවයේ යොදවා ඇත. දෙපාර්තමේන්තුව පත්ව ඇති ගැටලුකාරී තත්ත්වය පෙන්වා දෙමින් මෙම නඩුව මෝසමක් මඟින් නැවත කැඳවූ අතර එහිදී නඩුවේ පාර්ශවකරුවන් වෙතින් එකඟතාවය ලබා ගන්නා ලෙස දැනුම් දුන් අතර, ඒ අනුව ඉදිරි කටයුතු කරනු ලබයි.

- ප්‍රාථමික සේවා ගණයේ තනතුරු සඳහා (පුරාවිද්‍යා සහයක/මුරකරු) 2023.12.31 දින වන විට 3275 බඳවා ගෙන ඇති අතර ඉතිරි පුරප්පාඩු සංඛ්‍යාවද බහුකාර්ය දෙපාර්තමේන්තුවේ පුහුණුලාභීන් ප්‍රමාණයක් බඳවා ගැනීමට නියමිතය.

- එමෙන්ම ජාතික අයවැය චක්‍රලේඛ 03/2022 අනුව රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් නතර කර ඇති හෙයින් පවතින පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා අනුමැතිය ලබා දෙන ලෙසට මුදල් අමාත්‍යාංශය වෙත ඉල්ලීම් යොමු කර ඇතැත්, ඒ සඳහා අනුමැතිය ලැබී නොමැති බැවින් බඳවා ගැනීම් සිදු කල නොහැකි වී ඇත.

6.3 මානව සම්පත් සංවර්ධනය

අනු අංකය	පුහුණු වැඩසටහනේ නම	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජන (රුපියල්)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමවුම / ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
01.	වැටුප් සකස් කිරීම සම්බන්ධ සිද්ධාන්ත / ප්‍රායෝගික පුහුණු වැඩසටහන	දින 01	30,000/-		දේශීය	ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කාර්යාලයන්හි වැටුප් සකස් කරනු ලබන නිලධාරීන් / නවක නිලධාරීන් වැටුප් සැකසීම පිළිබඳ අවශ්‍ය දැනුම ලබා දීම.
02.	පුරාවිද්‍යා දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩල රැස්වීම	දින 01	18,175/-		දේශීය	පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ඉදිරි සැලැස්ම පිළිබඳ සාකච්ඡා කිරීම.
03.	ගබඩා හා භාණ්ඩ සමීක්ෂණ පුහුණුව	දින 01	114,470/-		දේශීය	ගබඩා භාණ්ඩ පිළිබඳ හා භාණ්ඩ සමීක්ෂණ කටයුතු පිළිබඳ නිලධාරීන් දැනුවත් කිරීම.
04.	වවුචර් පරීක්ෂා කිරීමේ පුහුණුව	දින 01	59,570/-		දේශීය	වවුචර් පරීක්ෂාව පිළිබඳ නිලධාරීන්හට දැනුම ලබා දීම.
05.	අත්තිකාරම් බී ගිණුම සම්බන්ධ පුහුණුව	දින 01	44,275/-		දේශීය	අත්තිකාරම් බී ගිණුම සම්බන්ධයෙන් නවක නිලධාරීන් හා අනෙකුත් නිලධාරීන් දැනුවත් කිරීම.
06.	ප්‍රසම්පාදන පිළිබඳ පුහුණුව	දින 01	56,950/-		දේශීය	ප්‍රසම්පාදන කටයුතු කරනු ලබන දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන්හට ඒ පිළිබඳ දැනුම ලබා දීම.
07.	කළමනාකරණ හා නායකත්ව කුසලතා පුහුණු වැඩසටහන	දින 01	25,369/-		දේශීය	නිලධාරීන්හට කළමනාකරණය හා නායකත්ව කුසලතා වර්ධනය කර ගැනීම සම්බන්ධයෙන් දැනුම ලබා දීම.
08.	ශෛලමය ස්මාරකවල ලයිකන ඉවත්	දින 01	100,000/-		දේශීය	ස්මාරක සංරක්ෂණය පිළිබඳ ශාස්ත්‍රීය දැනුම ලබා දීම.

	කිරීමේ පුහුණු වැඩසටහන					
09.	කළමනාකරණය හා ලිපිගොනුකරණය පිළිබඳ පුහුණු වැඩසටහන	දින 01	9,800/-		දේශීය	පාලන අංශයේ නිලධාරීන් හා නවක නිලධාරීන් වෙත කාර්යාල කළමනාකරණය හා ලිපි ගොනු ආශ්‍රිත කටයුතු කිරීම පිළිබඳ දැනුම ලබා දීම.
10.	තාක්ෂණ සේවා නිලධාරීන් සඳහා සංරක්ෂණ ගැටලු පිළිබඳ දැනුවත් කිරීම	දින 01	33,250/-		දේශීය	වාස්තුවිද්‍යා අංශයේ තාක්ෂණ සේවා නිලධාරීන්හට ශාස්ත්‍රීය දැනුම ලබා දීම.
11.	දෙපාර්තමේන්තු කාර්ය භාරයට අදාළ රියදුරු රාජකාරි පිළිබඳ දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන	දින 01	32,056/-		දේශීය	දෙපාර්තමේන්තුවේ රාජකාරීන් සඳහා රියදුරන්ගේ වගකීම හා රථ වාහන හැසිරවීම පිළිබඳ දැනුම ලබා දීම
12.	චංචල පුරාවස්තු ලේඛනගත කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන	දින 01	35,900/-		දේශීය	නිලධාරීන්හට ශාස්ත්‍රීය දැනුම ලබා දීම.
13.	සේවක කළමනාකරණය අනෝන්‍ය සුහදශීලිත්වය ආරක්ෂා කර ගනිමින් රාජකාරී ඉටු කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන	දින 01	74,284.22		දේශීය	නිලධාරීන් අතර සුහදශීලීත්වය ගොඩ නගා ගනිමින් රාජකාරී කටයුතු කිරීමට අවශ්‍ය සංකල්ප හා ක්‍රියාකාරකම් පිළිබඳ දැනුම ලබා දීම.
14.	පුරාවිද්‍යා ස්ථානයක සැලසුම් ඇඳීම හා ඒ පිළිබඳව නිලධාරීන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන	දින 01	19,150/-		දේශීය	නිලධාරීන්ට සැලසුම් ඇඳීම පිළිබඳ ශාස්ත්‍රීය දැනුම ලබා දීම.
15.	අම්පාර / මඩකලපුව ප්‍රාදේශීය කාර්යාලයට අනුයුක්ත කරන	දින 01	88,500/-		දේශීය	නවක පත්වීම් ලාභීන්ට රාජ්‍ය සේවය පිළිබඳ හා කාර්යාලීය කටයුතු පිළිබඳ දැනුම ලබා

	ලද නවක පත්වීම් ලාභීන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන					දීම.
16.	වේ හානි මර්දන කටයුතු සම්බන්ධයෙන් රසායන දැනුම ලබා දීමේ පුහුණු වැඩ සටහන	දින 01	49,900/-		දේශීය	නිලධාරීන්ට වේ හානි මර්දන කටයුතු පිළිබඳ දැනුම ලබා දීම.
	මුළු වියදම		**791,649.22**			

- **ආයතනයේ කාර්යසාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේදැයි යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.**

  ශාස්ත්‍රීය කටයුතු කරන දෙපාර්තමේන්තුවක් වශයෙන් එම ශාස්ත්‍රීය දැනුම යාවත්කාලීන කර ගැනීමට හා දැනුම වැඩිදියුණු කර ගැනීමට අවශ්‍ය බැවින් දේශීය හා විදේශි පුහුණු ලබා දීම අවශ්‍ය වේ. එමෙන්ම ආයතනයේ පරිපාලනමය අංශයන්හි සේවය කරනු ලබන නිලධාරීන්ගේ දැනුම දියුණු කිරීම සඳහා (කාර්ය පටිපාටික රීති, ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි වැනි කාර්යාල ක්‍රමවේදයන් පිළිබඳ) පුහුණුව ලබා දිය යුතුව ඇත. රාජකාරී කාර්යක්ෂමතාවය වර්ධනය සඳහා ආකල්පමය වෙනසක් නිරන්තරයෙන් ගොඩනැගිය යුතු බැවින් ආකල්ප සංවර්ධනාත්මක වැඩසටයන් ද ඵලදායිතා විෂය පිළිබඳ දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් සිදු කළ යුතුය.

7.පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
1	**පහත සඳහන් මුල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1.	වාර්ෂික මුල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2.	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3.	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අනුකූල නොවේ	මෙම ගිණුම් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙහි ක්‍රියාත්මක නොවේ.	
1.4.	ගබඩා අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ		
1.5.	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ		
1.6.	වෙනත්	අනුකූල නොවේ		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**			
2.1.	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.2.	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත් කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.3.	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.4.	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.5.	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
2.6.	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.7.	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
2.8.	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.9.	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.10.	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.11.	උප පත්‍රිකා පොත් ලේඛනය (GA - N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
3	**මුල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම. (මු.රෙ. 135)**			
3.1.	මුල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම.	අනුකූල වේ		
3.2.	මුල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම.	අනුකූල වේ		
3.3.	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම.	අනුකූල වේ		
3.4.	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම.	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම.**			
4.1.	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
4.2.	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
4.3.	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
4.4.	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
4.5.	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1.	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබාදී තිබීම.	අනුකූල නොවේ		නිලධාරීන් දැනුවත් කර ඇත.
6	**අභ්‍යන්තර විගණනය**			
6.1.	මු.රෙ. 134(2) DMA/1 - 2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
6.2.	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම.	අනුකූල නොවේ	ප්‍රාදේශීය කාර්යාල මඟින් තොරතුරු ලබා දිය යුතු වාර්තා සඳහා ප්‍රමාද වී පිළිතුරු සපයා ඇත.	
6.3.	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
6.4.	මුදල් රෙගුලාසි 134(4) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1.	DMA චක්‍රලේඛ 1 - 2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුල පවත්වාගෙන තිබීම.	අනුකූල නොවේ	2023 වසර සඳහා විගණන කළමණාකරන කමිටු රැස්වීම් 03 ක් පවත්වා ඇත.	4 වන රැස්වීම පැවැත්වීමට කටයුතු සැලසුම් කර ඇත.

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
8	**වත්කම් කළමනාකරණය**			
8.1.	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණ කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.2.	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙක් පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම.	අනුකූල වේ		
8.3.	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.4.	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම.	අනුකූල වේ		
8.5.	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම.	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1.	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
9.2.	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම.	අනුකූල නොවේ	2020 වර්ෂයේ හා 2021 වර්ෂයේ රටේ පැවති කොරෝනා වසන්ගත තත්ත්වය හේතුවෙන් වාර්ෂික අපහරණය සඳහා වන අපහරණ කමිටුව පත්කිරීමට නොහැකි වූ අතර, 2023 වර්ෂයේ සමීක්ෂණ කටයුතු සඳහා පත් කරන ලද අපහරණ කමිටු වාර්තාවේ නිර්දේශ අනුව අපහරණය කළ යුතු වාහන 04 ක් හඳුනා ගෙන ඇත. එම වාහන අපහරණය කිරීමේ කටයුතු සඳහා අදාළ තොරතුරු මේ වන විට ගීණුම් අංශය වෙත ලබා දී ඇත.	2024 වර්ෂයට ද කමිටුව පත්කර ගර්හිත වාහන හඳුනා ගැනීමෙන් අනතුරුව අපහරණ කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.
9.3.	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
9.4.	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල නොවේ	වාර්තා වී ඇති වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ. 104 වාර්තා ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කර ඇති අතර එම වාර්තා ලද පසු ඉදිරි කටයුතු කරනු ලැබේ.	රථ වාහන අනතුරක් සිදු වූ වහාම ඒ පිළිබඳ මු.රෙ. අනුව කටයුතු කිරීමට අවශ්‍ය සැලැස්මක් සකසා ඒ අනුව ඉදිරි කටයුතු කිරීම.
9.5.	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම.	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
9.6.	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1.	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
10.2.	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
10.3.	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1.	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2.	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදන උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම.	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1.	සීමාවන්වලට අනුකූල වීම.	අනුකූල වේ		
12.2.	හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම.	අනුකූල වේ		
12.3.	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල නොවේ		නිරවුල් කිරීමේ කටයුතු සිදු කරමින් පවති.
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1.	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
13.2.	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1.	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම.	අනුකූල වේ		
14.2.	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
14.3.	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම.	අනුකූල වේ		
14.4.	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1.	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම.	අනුකූල වේ		
15.2.	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම.	අනුකූල වේ		
15.3.	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අදාළ නොවේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1.	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුල කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම.	අනුකූල නොවේ	දැනට දෙපාර්තමේන්තුව වෙත අනුමත සංවර්ධන නිලධාරීන් තනතුරු ප්‍රමාණය ඉක්මවා සංවර්ධන නිලධාරීන් 31 දෙනෙකු සේවයේ යෙදේ. එම 31	

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
			දෙනාගෙන් යුතු තනතුරු 31 අනුමත කරවා ගැනීම සඳහා මු.රෙ. 71 සම්පූරණ කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් යොමු පත් කර ඇත.	
16.2.	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම.	අනුකූල වේ		
16.3.	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම.**			
17.1.	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
17.2.	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබාදී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම.	අනුකූල වේ අනුකූල නොවේ	ඉදිරියේදී එම පහසුකම් සැලසීමට කටයුතු කෙරේ.	
17.3.	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම.	අනුකූල නොවේ	ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත.	

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1.	අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල වේ		
18.2.	එම චක්‍රලේඛයේ 2.3. ඡේදය පරිදි, පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම.**			
19.1.	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
19.2.	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල නොවේ	පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා වෙන් කර තිබූ ප්‍රතිපාදන ප්‍රමාණය සහ යෝජිත පුහුණු වැඩසටහන් වල ස්වභාවය සැලකිල්ලට ගනිමින් සෑම නිලධාරියකුටම ලබා දිය හැකි උපරිම පුහුණු පැය ගණනක් ලබා දීමට හැකි සෑම අයුරකින්ම කටයුතු කළ නමුත් 2023 වර්ෂයේ එය නිශ්චිත අයුරින් සිදු කර ගැනීමට නොහැකි විය.	2024 වසර සඳහා සෑම නිලධාරියෙක්ම ඉලක්ක කරමින් වඩාත් පුළුල් පුහුණු මාතෘකා ඔස්සේ වැඩසටහන් මෙහෙය වීමටත්, ඒ තුළින් වැඩි නිලධාරීන් පිරිසකට පුහුණු අවස්ථා ලබා දීමටත්, අනුමත ප්‍රතිපාදන සීමාව තුළ සෑම නිලධාරියෙකුම ආවරණය වන පරිදි පුහුණු වැඩසටහන්

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
				සංවිධානය කිරීමටත් කටයුතු කරනු ඇත.
19.3.	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල වේ		
19.4.	ඉහත චක්‍රලේඛයේ 6.5. ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම.	අනුකූල නොවේ	ශ්‍රී ලංකා පරිපාලන සේවයට අයත් සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ (පුහුණු හා වෙනත්) තනතුර පුරප්පාඩුව පවතී.	දැනට සහකාර / නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) ලෙස කටයුතු කරන නිලධාරියා මඟින්ම අදාළ පුහුණු කටයුතු සිදු කරනු ලබයි.
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම.**			
20.1.	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල වේ		